15 ඒකකය
සත්ත්ව පාලනය

(1) වටනය,
1) යනු කුකුළාගේ ආහාර එන්සයිම මඟින් ජීරණය වන ස්ථානය වේ.
2) යනු කුකුළාගේ ආහාර යාන්ත්‍රික ව ජීරණය වන ස්ථානය වේ.
3) යනු ගවයාගේ ආහාර යාන්ත්‍රික ව ජීරණය වන ස්ථානය වේ.
4) මී වදයක් වැනි පෙනුමක් සහිත ය.
5) යනු කුකුළාගේ ආහාර ගබඩා කරන ස්ථානය වේ. (2000)

(2) ඩිම්බ මෝචනය සඳහා බලපාන හෝර්මෝනය වනුයේ,
1) ඊස්ට්‍රජන් ය.
2) ප්‍රෝජෙස්ටොරොන් ය.
3) ලුටෙයිනීකරණ හෝර්මෝනය (LH) ය.
4) ස්‍යුනිකා උත්තේජක හෝර්මෝනය ය.
5) ටෙස්ටොස්ටෙරොන් ය. (2000)

(3) බිත්තර සුදු මදය ස්‍රාවය වීම සිදුවන්නේ,
1) ග්‍රීවිකාව (කෘකටය) පෙදෙසෙහි ය.
2) කාහලිකාවෙහි (නිවාපය) ය.
3) මැග්නමය (මහාජිද්‍රය) පෙදෙසෙහි ය.
4) ඩිම්බකෝෂයෙහි ය.
5) ගර්භාෂයෙහි ය. (2000)

(4) කුකුළන්ට කොක්සිඩියෝසිස් සෑදෙන්නේ,
1) වයිරස් මඟිනි.
2) බැක්ටීරියා මඟිනි.
3) ප්‍රෝටොසෝවා මඟිනි.
4) දිලීර මඟිනි.
5) ඉහත කිසිවකින් නොවේ. (2000)

(5) මී කිරිවල අඩංගු සාමාන්‍ය මේද ප්‍රමාණය වනුයේ,
1) 6% කි. 2) 8% කි. 3) 10% කි. 4) 12% කි. 5) 14% කි. (2000)

(6) බිත්තර කහ මදයේ කහ වර්ණයට හේතුව,
1) සැන්තොෆිල් අඩංගු වීම ය.
2) විටමින් A අඩංගු වීම ය.
3) මයෝග්ලෝබින් අඩංගු වීමය.
4) විටමින් E සංකීර්ණය අඩංගු වීම ය.
5) සල්ෆර් අඩංගු වීම ය. (2000)

(7) සාන්ද්‍ර ආහාරවල අඩංගු දළ තන්තු ප්‍රමාණය,
1) 12% ට වඩා අඩු විය යුතු ය.
2) 14% ට වඩා අඩු විය යුතු ය.
3) 16% ට වඩා අඩු විය යුතු ය.
4) 18% ට වඩා අඩු විය යුතු ය.
5) 20% ට වඩා අඩු විය යුතු ය. (2000)

(8) කුකුල් බිත්තරයක බීජෞෂණ (රක්කවීමේ) කාලය,
1) දින 30 කි.
2) දින 28 කි.
3) දින 21 කි.
4) දින 14 කි.
5) ඉහත කිසිවක් නොවේ. (2000)

(9) එරියකගේ මද කාලය,
1) පැය 24 කට අඩු ය.
2) දින 1 – 2 කි.
3) දින 2 – 3 කි.
4) දින 4 – 5 කි.
5) දින 5 – 6 කි. (2000)

(10) එළදෙනකගේ සංකීර්ණ ආමාශයේ ධාරිතාවය වනුයේ,
1) ලීටර 50 – 100 කි.
2) ලීටර 101 – 150 කි.
3) ලීටර 175 – 225 කි.
4) ලීටර 250 – 300 කි.
5) ලීටර 300 ට වැඩි ය. (2001)

(11) අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල වනුයේ,
1) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, මෙතියොනීන් සහ ට්‍රිප්ටොපෑන් ය.
2) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, මෙතියොනීන් සහ ඇලනීන් ය.
3) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, සිස්ටීන් සහ ඇලනීන් ය
4) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, ග්ලයිසීන් සහ සිස්ටීන් ය.
5) හිස්ටිඩීන්, ටයිරොසීන්, ග්ලයිසීන් සහ සිස්ටීන් ය. (2001)

(12) මේදයෙහි ද්‍රාව්‍ය වන විටමින වනුයේ,
1) A, B, C සහ D ය.
2) A, B, D සහ K ය.
3) A, B,C සහ K ය.
4) A, D, E සහ K ය.
5) A, B, E සහ K ය.
(2001)

(13) උරගන්ගේ දළ තන්තු ජීර්ණය වනුයේ,
1) ආමාශයේ දී ය.
2) කුඩා අන්ත්‍රයේ දී සහ මහ අන්ත්‍රයේ දී ය.
3) උණ්ඩුකපුච්ඡයේ දී ය.
4) ජඨරාශියේ දී ය.
5) බහුනැමියේ දී ය.
(2001)

(14) වාණිජ ලෙස ඇතිකරන කිකිලියන්ගේ ඩිම්බ මෝචනයේ සිට බිත්තර දැමීම දක්වා ගතවන කාලය,
1) පැය 10 – 12 කි.
2) පැය 15 – 18 කි.
3) පැය 20 – 22 කි.
4) පැය 24 – 26 කි.
5) පැය 27 – 29 කි.
(2001)

(15) බිත්තරයක මේදය බහුල ලෙස අඩංගු වනුයේ,
1) සුදු මදයේ සහ කහමදයේ ය.
2) තුනී සහ ඝන සුදු මදයේ ය.
3) ඝන සුදු මදයේ සහ කහ මදයේ ය.
4) කහ මදයේ සහ කටුවේ පටලවල ය.
5) කහ මදයේ ය.
(2001)

(16) රූමනයේ pH පරාසය වනුයේ,
1) 2.5 සිට 3.5 වේ.
2) 4.0 සිට 5.0 වේ.
3) 5.5 සිට 6.5 වේ.
4) 7.0 සිට 8.0 වේ.
5) ඉහත සඳහන් කිසිවක් නොවේ.
(2001)

(17) පෙප්සින් සහ ඇමයිලේස් ස්‍රාවය වනුයේ,
1) රූමනයේ දී ය.
2) ජඨරාශියේ දී ය.
3) ග්‍රහණියේ දී ය.
4) කුඩා අන්ත්‍රයේ දී ය.
5) මහා අන්ත්‍රයේ දී ය.
(2001)

(18) කිරිවලට සාපේක්ෂව මුල්කිරිවල,
1) වැඩිපුර ඝන ද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
2) වැඩිපුර ඝන ද්‍රව්‍ය, වැඩිපුර ප්‍රෝටීන් සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
3) අඩු ඝන ද්‍රව්‍ය, වැඩිපුර ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
4) අඩු ඝන ද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
5) අඩු ඝන ද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
(2001)

(19) මොල්ලිය සහ තැල්ල මගින් ශරීරයේ පෘෂ්ඨීය ක්ෂේත්‍රඵලය වැඩිකර ගැනීම දක්නට ලැබෙනුයේ,
1) ඉන්දීය ගව වර්ගවල ය.
2) යුරෝපීය ගව වර්ගවල ය.
3) ෆ්‍රීසියන් ගවයින්ගේ ය.
4) ජර්සි ගවයින්ගේ ය.
5) සානන් එළුවන්ගේ ය.
(2001)

(20) කෘත්‍රිම සිංචනය සඳහා ශුක්‍රාණු එකතු කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ,
1) පොළොන්නරුවේ ය.
2) මැල්සිරිපුර ය.
3) කුණ්ඩසාලේ ය.
4) වැලිසර ය.
5) අඹේවෙල ය.
(2002)

(21) සත්ත්ව ආහාරයක ප්‍රෝටීන පරිපූරකයක් ලෙස භාවිත කළ හැකි සංඝටකයක් වනුයේ,
1) සහල් නිවුඩු ය.
2) පොල් පුන්නක්කු ය.
3) බඩ ඉරිඟුය.
4) සයිලේජ් ය.
5) ඉඳල් ඉරිඟු ය.
(2002)

(22) පරිණත ගොවිපොළ සතෙකුගේ ප්‍රෝටීන ජීරණය සිදු කරන ප්‍රධාන එන්සයිමය වනුයේ,
1) ඇමයිලේස් ය.
2) ලයිපේස් ය.
3) පෙප්සින් ය.
4) ට්‍රිප්සින් ය.
5) ඩයිපෙප්ටයිඩේස් ය.
(2002)

(23) එළදෙනකගේ කිරි අස්වැන්නට බලපාන ප්‍රධානම පරිසර සාධකය වනුයේ,
1) පරිසර උෂ්ණත්වයයි.
2) වර්ෂාපතනයයි.
3) සාපේක්ෂ ආර්ද්‍රතාවයයි.
4) සුළඟේ වේගයයි.
5) ආලෝක තීව්‍රතාවය සහ දිවා කාලයේ දිගයි.
(2002)

(24) කුකුළන්ට වැළඳෙන කොක්සිඩියෝසිස් රෝගයේ රෝග කාරකය වනුයේ,
1) බැක්ටීරියාවෙකි.
2) දිලීරයකි.
3) ප්‍රොටොසෝවාවෙකි.
4) වයිරසයකි.
5) කිනිතුල්ලෙකි.
(2002)

(25) කිරිවල අඩංගු ප්‍රධාන සංඝටකය වනුයේ,
1) ප්‍රෝටීන් ය. 2) ඛනිජ ය. 3) කාබෝහයිඩ්‍රේට ය.
4) මේදය ය. 5) ජලය ය. (2002)

(26) හොඳින් ආහාර දී පාලනය කළ ගවයෙකුගේ රූමනයේ pH පරාසය වනුයේ,
1) 4.5 සිට 4.8 දක්වා වේ. 2) 5.0 සිට 5.3 දක්වා වේ. 3) 5.6 සිට 5.9 දක්වා වේ.
4) 6.7 සිට 6.9 දක්වා වේ. 5) 7.2 සිට 7.5 දක්වා වේ. (2002)

(27) එළියකුගේ මද චක්‍රයේ දිග,
1) දින 15 කි. 2) දින 18 කි. 3) දින 21 කි.
4) දින 30 කි. 5) වෙනස්වන සුලු ය. (2002)

(28) ශුක්‍රාණු ජනනයට බලපාන පිටියුටරි හෝර්මෝන වනුයේ,
1) සූනික උත්තේජන හෝර්මෝනය (FSH) සහ ලූටිනීකාරක හෝර්මෝනය (LH) වේ.
2) FSH සහ ටෙස්ටොස්ටෙරෝන් වේ.
3) LH සහ ප්‍රෝලැක්ටින් වේ.
4) FSH සහ ප්‍රෝලැක්ටින් වේ.
5) LH සහ ප්‍රෝලැක්ටින් වේ. (2002)

(29) කිකිළියකගේ ගොදුර ආහාර,
1) පැසීම සිදුවන ස්ථානය වේ. 2) ගබඩා වන ස්ථානය වේ.
3) රසායනික ජීරණය සිදුවන ස්ථානය වේ. 4) යාන්ත්‍රික ජීරණය සිදුවන ස්ථානය වේ.
5) ජීරණය හා අවශෝෂණය සිදුවන ස්ථානය වේ. (2003)

(30) එළදෙනකගේ ඩිම්බ සංසේචනය සිදුවනුයේ,
1) යෝනියේ දී ය. 2) ගර්භාෂ ග්‍රීවයේ දී ය. 3) පැලෝපීය නාලයේ දී ය.
4) ගර්භාෂයේ ඉහළ කොටසේ දී ය. 5) ගර්භාෂයේ පහළ කොටසේ දී ය. (2003)

(31) ගොවිපොළ සතුනගේ කුර සහ මුඛ රෝගයේ හේතු කාරක ජීවියා / ජීවීන්,
1) බැක්ටීරියාවකි. 2) වයිරසයකි. 3) දිලීරයකි.
4) කෘමියෙකි. 5) ඉහත දක්වන සියල්ලම වේ. (2003)

(32) ගැහැනු එළුවාගේ මද චක්‍රයේ දිග,
1) දින 15 කි. 2) දින 18 කි. 3) දින 21 කි. 4) දින 24 කි. 5) දින 30 කි. (2003)

(33) මී කිරිවල මේදයෙහි වර්ණය,
1) සුදු පාට වේ. 2) කහ පාට වේ. 3) සුදු පාට හෝ කහ පාට වේ.
4) ගව ආහාර මත රඳා පවතී. 5) මීගව වර්ගය මත රඳා පවතී. (2003)

(34) කිරිවල ප්‍රධාන සංඝටකය,
1) ප්‍රෝටීන වේ. 2) මේදය වේ. 3) ජලය වේ.
4) ඛනිජ වේ. 5) කිරි වර්ගය අනුව වෙනස් වේ. (2003)

(35) පීත දේහය මගින් ස්‍රාවය කරන හෝර්මෝනය,
1) ප්‍රොජෙස්ටරෝන් වේ. 2) ඊස්ට්‍රජන් වේ. 3) රිලැක්සින් වේ.
4) ටෙස්ටොස්ටෙරෝන් වේ. 5) ඩයිඑතයිල් ස්ටිල්බෙස්ට්‍රෝල් වේ. (2003)

(36) සමහරක් ගව වර්ගවල දක්නට ලැබෙන මොල්ලිය හා තැල්ලෙහි ප්‍රධාන කාර්යය වනුයේ,
1) ජලය ගබඩා කිරීම ය. 2) බාහිර ස්වරූපය වැඩි දියුණු කිරීම ය.
3) මතුපිට ක්ෂේත්‍රඵලය ඉහළ දැමීම ය. 4) මේද සංචිත කිරීම ය.
5) ඉහත සඳහන් කිසිවක් නොවේ. (2003)

(37) කිකිළි බිත්තරයක අඩංගු ප්‍රධාන සංඝටකය වනුයේ,
1) ජලය 2) ප්‍රෝටීන 3) මේද 4) කැල්සියම් 5) ඇල්බියුමින් (2004)

(38) සෝයා බෝංචි අන්නයේ (soya bean meal) අඩංගු සාමාන්‍ය දළ ප්‍රෝටීන ප්‍රමාණය,
1) 20 – 22 % කි. 2) 30 – 33 % කි. 3) 40 – 44% කි.
4) 50 – 55 % කි. 5) 60 – 66 % කි. (2004)

(39) වසු පැටවෙකුගේ අග්න්‍යාසයෙන් ස්‍රාවය වන ප්‍රධාන ප්‍රෝටීන ජීරක එන්සයිමය,
1) ට්‍රිප්සින් ය. 2) කයිමොට්‍රිප්සින් ය. 3) පෙප්සින් ය.
4) රෙනින් ය. 5) ශ්ලේෂමල ය. (2004)

(40) පුරුෂ ලිංගික හෝර්මෝනයක් සඳහා උදාහරණයක් වනුයේ,
1) ඊස්ට්‍රජන්. 2) ප්‍රොජෙස්ටෙරොන්. 3) ටෙස්ටෙස්ටෙරෝන්.
4) ඩයි – ඊතයිල් ස්ටිල්බෙස්ට්‍රෝල්. 5) තයිරොක්සීන්. (2004)

(41) කුකුළන්ට වැළදෙන ගම්බෝරෝ (Gamboro)රෝගයේ හේතු කාරකය වනුයේ,
1) බැක්ටීරියාවකි. 2) වයිරසයකි. 3) දිලීරයකි.
4) ප්‍රෝටොසෝවාවකි. 5) බාහිර පරපෝෂිතයෙකි. (2004)

(42) දළ ආහාරවල,
1) 18% වැඩියෙන් දළ තන්තු අඩංගු වේ. 2)18% අඩුවෙන් දළ තන්තු අඩංගු වේ.
3) 20% වැඩියෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ. 4) 20% අඩුවෙන් දළ ප්‍රෝටීන අඩංගු වේ.
5) 20% වැඩියෙන් දළ තන්තු හා දළ ප්‍රෝටීන අඩංගු වේ. (2004)

(43) ගවයාගේ සංකීර්ණ ආමාශයේ කොටස් හතර වනුයේ,
1) රෝමන්ථය, බහුනැමිය, ග්‍රහණිය සහ උණ්ඩුකයයි.
2) රෝමන්ථය, විතංශිකාව, ග්‍රහණිය සහ ජඨරාශයයි.
3) රෝමන්ථය, ජඨරාශය,ශේෂාන්ත්‍රකය සහ විතංශිකාවයි.
4) රෝමන්ථය, ග්‍රහණිය, ශුන්‍යාන්ත්‍රකය සහ උණ්ඩුකයයි.
5) රෝමන්ථය, විතංශිකාව, ජඨරාශය සහ බහුනැමියයි. (2004)

(44) රෝගී ගොවිපොළ සතෙකු,
1) නිතරම උණ ගතියෙන් පෙළේ.
2) සාමාන්‍ය ලෙස ආහාර අනුභව කරයි.
3) අනෙකුත් සතුන්ගෙන් වෙන් වී සිටීමට කැමැත්තක් දක්වයි.
4) පැහැදිලි හා දිලිසෙන ඇස් සහිත ය.
5)නිසියාකාර පරීක්ෂණයකින් තොරව හඳුනා ගත නොහැකි ය. (2004)

(45) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කිරි ගොවීන් අතර කෘත්‍රිම සිංචනය ජනප්‍රිය නොවීමට ප්‍රධාන හේතුව,
1) එමගින් පිරිමි වසුපැටවුන් වැඩිපුර බිහිවීම ය.
2) එය අපගේ කිරි දෙනුන්ට නුසුදුසු වීම ය.
3) ඒ සඳහා ඇති පහසුකම් සීමාසහිත වීම ය.
4) ඊට අදාල තාක්ෂණය ශ්‍රී ලංකාවේ නොමැති වීම ය.
5) ස්වාභාවික පට්ටි දැමීම සඳහා පට්ටි ගොනුන් අවශ්‍ය තරම් සිටීම ය. (2004)

(46) එළ කිරිවලින් මී කිරි පහසුවෙන් වෙන් කර හඳුනා ගත හැක්කේ, මී කිරි
1) සුදු පැහැවීම හා අඩු මේද ප්‍රමාණයක් තිබීමෙනි.
2) කහ පැහැවීම හා අඩු මේද ප්‍රමාණයක් තිබීමෙනි.
3) සුදු පැහැවීම හා වැඩි මේද ප්‍රමාණයක් තිබීමෙනි.
4) කහ පැහැවීම හා වැඩි මේද ප්‍රමාණයක් තිබීමෙනි.
5) විශේෂිත ගන්ධයක් සහිත නිසාය. (2004)

(47) උණුසුම් පරිසරයක දී එළදෙනකගේ කිරි අස්වැන්න අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය හැක්කේ,
1) ආහාර ආගනුව වැඩි වීම හා ජල ආගනුව අඩුවීම ය.
2) ආහාර ආගනුව අඩු වීම හා ජල ආගනුව වැඩිවීම ය.
3) අඩු ක්‍රියාශීලී බව ය.
4) ශරීරයෙන් අධික ලෙස ජලය පිටවීම ය.
5) වැඩිපුර කිරි නිෂ්පාදනයට අවශ්‍ය තරම් ජලය නොමැති වීම ය. (2004)

(48) කිකිළි බිත්තරයක අඩංගු ප්‍රෝටීන ප්‍රමාණය වනුයේ,
1) 5 – 7% 2) 10 – 12% 3) 14 – 16% 4) 18 – 20% 5) 20 – 24% (2005)

(49) ඊස්ට්‍රජන් ස්‍රාවය වනුයේ,
1) වෘෂණයෙනි. 2) ඩිම්බකෝෂයෙනි. 3) පිට්යුටරි ග්‍රන්ථියෙනි.
4) බුරුල්ලෙනි. 5) හයිපොතැලමසෙනි. (2005)

(50) ඔක්සිටොසින්වල ප්‍රධාන කාර්යය වනුයේ,
1) ශුක්‍රාණු නිෂ්පාදනය ය. 2) ඩිම්බ සංසේචනය ය. 3) ගර්භනීභාවය පවත්වා ගැනීම ය.
4) කිරි මුදා හැරීම ය. 5) ඩිම්බ පරිණත කිරීම ය. (2005)

(51) බුරුලු ප්‍රදාහ (mastitis) රෝගයේ රෝගකාරකයා වනුයේ,
1) බැක්ටීරියාවකි. 2) වයිරසයකි. 3) දිලීරයකි.
4) ප්‍රෝටොසෝවාවෙකි. 5) බාහිර පරපෝෂිතයෙකි. (2005)

(52) එළදෙනකගේ මද චක්‍රයේ සාමාන්‍ය දිග වනුයේ,
1) දින 15 කි. 2) දින 18 කි. 3) දින 21 කි. 4) දින 28 කි. 5) දින 30 කි. (2005)

(53) ඊරියකගේ ගර්භනී කාලයේ සාමාන්‍ය දිග වනුයේ,
1) දින 30 කි. 2) දින 101 කි. 3) දින 114 කි.
4) දින 150 කි. 5) දින 270 කි. (2005)

(54) සහාභිජනනය සිදුවන්නේ,
1) ඥාති නොවන ජීවීන් දෙදෙනෙකු අතරේ සිදුවන මුහුමකිනි.
2) ඥාති වන ජීවීන් දෙදෙනෙකු අතරේ සිදුවන මුහුමකිනි.
3) වර්ග (breeds) දෙකක් අතරේ සිදුවන මුහුමකිනි.
4) විශේෂ දෙකක් අතරේ සිදුවන මුහුමකිනි.
5) එකම විශේෂයකට අයත් ඕනෑම ජීවීන් දෙදෙනෙකු අතරේ සිදුවන මුහුමකිනි. (2005)

(55) ආහාර ජීරණය සඳහා පිත උදව් වනුයේ,
1) ජලය අවශෝෂණය කර ගැනීමෙනි. 2) මේදය තෛලෝදකරණය කිරීමෙනි.
3) එන්සයිම එකතු කිරීමෙනි. 4) pH අගය සකස් කිරීමෙනි.
5) බැක්ටීරියා මුදා හැරීමෙනි. (2005)

(56) කෘත්‍රිම සිංචනය සඳහා ගව ශුක්‍රාණු එකතු කිරීමට වඩාත් උචිත ක්‍රමය වනුයේ,
1) චූෂණ උපකරණයක් භාවිත කිරීම ය. 2) එළදෙනකගේ යෝනිය භාවිත කිරීම ය.
3) කෘත්‍රිම යෝනියක් භාවිත කිරීම ය. 4) විද්‍යුත් විසර්ජකයක් භාවිත කිරීම ය.
5) කුම්භිකා උත්තේජනය කිරීම ය. (2005)

(57) ප්‍රොජෙස්ටරෝන් ප්‍රධාන වශයෙන් ස්‍රාවය වනුයේ,
1) බුරුල්ලේ ය. 2) ඩිම්බ ප්‍රණාලවල ය. 3) ගර්භාෂයේ ය.
4) වෘෂණවල ය. 5) පීතදේහයේ ය. (2006)

(58) එළදෙනුන්ට වැළදෙන brucellosis රෝගයේ රෝග කාරකයා,
1) වයිරසයකි. 2) බැක්ටීරියාවකි. 3) පරපෝෂිතයෙකි.
4) දිලීරයකි. 5) ප්‍රෝටසෝවාවෙකි. (2006)

(59) පොල් පුන්නක්කුවල අඩංගු ප්‍රෝටීන ප්‍රතිශතය,
1) 10% – 12% කි. 2) 14% – 16% කි. 3) 20% – 21% කි.
4) 24% – 25% කි. 5) 28% – 30% කි. (2006)

(60) එළදෙනකගේ ගර්භණී කාලය,
1) දින 114 කි. 2) දින 180 කි. 3) මාස 07 කි.
4) මාස 09 කි. 5) මාස 12 කි. (2006)

(61) මී කිරිවල අඩංගු මේද ප්‍රතිශතය,
1) 2% – 3% කි. 2) 4% – 5% කි. 3) 6% – 8% කි.
4) 10% – 12% කි. 5) 12% ට වැඩි ය. (2006)

(62) කුරුලු උණ රෝගයේ රෝග කාරකයා,
1) දිලීරයකි. 2) වයිරසයකි. 3) බැක්ටීරියාවෙකි.
4) පරපෝෂිතයෙකි. 5) ප්‍රෝටසෝවාවෙකි. (2006)

(63) රූමන අන්තර්ගතයේ (rumen content) pH අගය
1) 1 – 2 කි. 2) 3 – 4 කි. 3) 4 – 5 කි.
4) 6 – 7 කි. 5) 7 – 8 කි. (2006)

(64) වාත අවකාශය (air sac) දක්නට ලැබෙනුයේ,
1) නැවුම් බිත්තරවල පමණි. 2) කිකිළි බිත්තරවල පමණි. 3) පැරණි බිත්තරවල පමණි.
4) තාරා බිත්තරවල පමණි. 5) සියලු ම බිත්තරවලය. (2006)

(65) පරිසර උෂ්ණත්වය වැඩි වූ විට,
A) එළදෙනුන්ගේ ආහාර ආගනුව අඩු වේ. B) ඌරන්ගේ ජල ආගනුව වැඩි වේ.
C) කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය අඩු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A පමණි. 2) B පමණි. 3) A සහ B පමණි.
4) B සහ C පමණි. 5) A,B සහ C සියල්ලම. (2006)

(66) කිකිළි බිත්තරයක බීජෞෂණ කාලය,
1) දින 18 කි. 2) දින 21 කි. 3) දින 24 කි. 4) දින 28 කි. 5) දින 30 කි. (2006)

(67) කැල්සියම්,
A) දත්වල අඩංගු වේ. B) සත්ත්ව ශරීරයේ ශක්තිය ගබඩා කිරීමට අවශ්‍ය වේ.
C) අස්ථි වර්ධනයට අවශ්‍ය වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ,
1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A සහ B පමණි. 5) A සහ C පමණි. (2006)

(68) එළදෙනකගේ කිරි එරීමට දායක වන ප්‍රධාන හෝර්මෝනය වනුයේ,
1) ටෙස්ටොස්ටරෝන් ය. 2) ප්‍රොජෙස්ටරෝන් ය. 3) ඔක්සිටෝසින් ය.
4) ඊස්ට්‍රජන් ය. 5) ප්‍රෝලැක්ටින් ය. (2007)

(69) ගොවිපළ සතුන්ගේ බුරුලු ප්‍රදාහය (Mastitis) සාදනුයේ,
1) වයිරස් විසිනි. 2) බැක්ටීරියා විසිනි. 3) දිලීර විසිනි.
4) මයිටාවන් විසිනි. 5) කිණිතුල්ලන් විසිනි. (2007)

(70) කුකුළන්ගේ ගම්බෝරෝ රෝගය සාදනුයේ,
1) වයිරස් විසිනි. 2) බැක්ටීරියා විසිනි. 3)දිලීර විසිනි.
4) මයිටාවන් විසිනි. 5) කිණිතුල්ලන් විසිනි. (2007)

(71) අත්‍යවශ්‍ය මේද අම්ල වනුයේ,
1) ලිනොලෙයික්, ඔලෙයික් සහ ලොරික් අම්ලයි.
2) ලිනොලෙයික්, ලිනොලෙනික් සහ ඇරචිඩික් අම්ලයි.
3) ලිනොලෙයික්, ලිනොලෙනික් සහ ඇරචිඩොනික් අම්ලයි.
4) ලිනොලෙනික්, ඇරචිඩොනික් සහ ස්ටියරික් අම්ලයි. (2007)
5) ලිනොලෙයික්, ඇරචිඩොනික් සහ ලෝරික් අම්ලයි.

(72) මේද ද්‍රාව්‍ය විටමින වනුයේ,
1) A, B, C සහ D ය. 2) A, C, D සහ E ය. 3) C,D,E සහ K ය.
4) B, D, E සහ K ය. 5) A, D, E සහ K ය. (2007)

(73) මුදවන ලද කිරිවල නිපදවෙන ප්‍රධාන අම්ලය වනුයේ,
1) ප්‍රොපියොනික් ය. 2) ලැක්ටික් ය. 3) ඇසිටික් ය.
4) සිට්‍රික් ය. 5) බියුට්‍රික් ය. (2007)

(74) එළිකිරිවල (cow milk) අඩංගු ප්‍රෝටීන ප්‍රමාණය වනුයේ,
1) 2.0% – 2.5% 2) 3.0% – 3.5% 3) 4.0% – 4.5%
4) 5.0% – 5.5% 5) 6.0% – 6.5% (2007)

(75) ක්‍රීප් ෆීඩ් (Creep Feed) දෙනුයේ,
1) දිනක් වයසැති කුකුළු පැටවුන් ය. 2) වසු පැටවුන් ය. 3) එළු පැටවුන් ය.
4) පව්වී ඌරන්ට ය. 5) කුඩා ඌරු පැටවුන්ට ය. (2007)

(76) කිකිළි බිත්තරයක බීජෞෂණ කාලය,
1) දින 15 කි. 2) දින 18 කි. 3) දින 21 කි. 4) දින 24 කි. 5) දින 28 කි. (2007)

(77) එළුදෙනකගේ ගර්භණී කාලය හා එළදෙනකගේ ගර්භණී කාලය පිළිවෙලින්,
1) මාස 3 ක් හා මාස 7 කි. 2) මාස 4 ක් හා මාස 7 කි. 3) මාස 5 ක් හා මාස 9 කි.
4) මාස 6 ක් හා මාස 9 කි. 5) මාස 9 ක් හා මාස 12 කි. (2007)

(78) රජයේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන පිහිටා ඇති ස්ථාන වනුයේ,
1) පොළොන්නරුව, කුණ්ඩසාලේ සහ තින්නවෙලි ය.
2) පොළොන්නරුව, කුණ්ඩසාලේ සහ යාපනය ය.
3) මහනුවර, කුණ්ඩසාලේ සහ තින්නවෙලි ය.
4) නුවරඑළිය, කුණ්ඩසාලේ සහ තින්නවෙලිය.
5) නුවරඑළිය, කුණ්ඩසාලේ සහ යාපනය ය.
(2007)

(79) සත්ත්ව ආහාර සඳහා සහල් නිවුඩු (rice polish) යොදා ගැනෙන්නේ,
1) ශක්ති පරිපූරකයක් ලෙස ය. 2) ප්‍රෝටීන පරිපූරකයක් ලෙස ය.
3) ඛනිජ පරිපූරකයක් ලෙස ය. 4) විටමින පරිපූරකයක් ලෙස ය.
5) කාබෝහයිඩ්‍රේට් පරිපූරකයක් ලෙස ය.
(2007)

(80) සංකීර්ණ ආමාශයේ විශාලතම කුටීරය,
1) රුමනයයි. 2) විතංශිකාවයි. 3) බහුනැමියයි.
4) ජඨරාශයයි. 5) අන්නස්‍රෝත ඇලියයි. (2008)

(81) සයිලේජ් සෑදීම යනු,
1) තෙත් ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
2) වියළි ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
3) කෘතිම ද්‍රව්‍ය එකතු කිරීම මගින් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
4) කිරි ගවයින් සඳහා පිළියෙල කරන සමතුලිත ආහාරයකි.
5) ගව නැම්බියන් සඳහා පිළියෙල කරන සමතුලිත ආහාරයකි.
(2008)

(82) ගොවිපොළ සතුන්ගේ වර්ධනය සහ නිෂ්පාදනය කෙරෙහි බලපාන වඩාත් වැදගත් පාරිසරික සාධකය,
1) පරිසර උෂ්ණත්වයයි. 2) සාපේක්ෂ ආර්ද්‍රතාවයයි. 3) දිවා කාලයේ දිගයි.
4) සුළඟේ දිශාවයි. 5) වර්ෂාපතනය සහ එහි ව්‍යාප්තියයි. (2008)

(83) වැඩිම කාබන් : නයිට්‍රජන් අනුපාතය වාර්තා වන්නේ,
1) තෘණවල ය. 2) පත් වර්ගවල ය. 3) පිදුරුවල ය.
4) පොල් ලෙලිවල ය. 5) ග්ලිරිසීඩියා පත්‍රවල ය. (2008)

(84) ඌරු පට්ටියක සිටින ඊරියන් රැළක් 2008 මාර්තු 01 දා කෘත්‍රිම සිංචනය මගින් ගැබ් ගන්වන ලදී. උන්ගෙන් වැඩි සංඛ්‍යාවක් පැටවුන් බිහි කරනු ඇත්තේ,
1) 2008 මැයි 22 දා ය. 2) 2008 ජුනි 22 දා ය. 3) 2008 ජූලි 22 දා ය.
4) 2008 අගෝස්තු 22 දා ය. 5) 2008 සැප්තැම්බර් 22 දා ය. (2008)

(85) සත්ත්ව ආහාරවල අඩංගු ශක්ති පරිපූරකවලට උදාහරණයක් වන්නේ,
1) මත්ස්‍ය අන්නය, මස් අන්නය සහ රුධිර අන්නය ය.
2) බඩ ඉරිඟු ඇට, සහල් නිවුඩු සහ පොල් තෙල් ය.
3) තිරිඟු පිටි, මොලෑසස් සහ සෝයා අන්නය ය.
4) මඤ්ඤොක්කා අල, තල පුන්නක්කු සහ සුනුසහල් ය.
5) තිරිඟු පිටි, සත්ත්ව තෙල් සහ කුකුළු අතුරුඵල අන්නය ය. (2008)

(86) රෝමාන්තිකයකුගේ රූමනය තුළ අධික ලෙස වායුව එක්රැස්වීම නිසා හටගන්නා රෝගී තත්ත්වය නම්,
1) ඇගලැක්ටියයි (agalactia). 2) පිපුමයි (bloat). 3) කුර සහ මුඛ රෝගයයි.
4) බෝවයින් ප්ලූරොනියුමෝනියාවයි (bovine pleuropneumonia).
5) කිරි උණයි (grass tentany). (2008)

(87) බස්නාහිර පළාතේ කුකුළු ගොවියෙක් ඔහුගේ ගොවිපලෙහි බිත්තර නිෂ්පාදනය දෙසැම්බර් හා ජනවාරි මාසවල දී තරමක් අඩුවන බව නිරීක්ෂණය කළේ ය. මීට ප්‍රධාන හේතුව විය හැක්කේ,
1) එම කාලයේ පවතින සිසිල් දේශගුණයයි.
2) එම කාලයේ පවතින කෙටි දිවා කාලයයි.
3) එම මාසවල පවතින වියළි කාලගුණික තත්ත්වයයි.
4) උත්සව කාලවල දී අධික ආලෝකකරණයයි (illumination).
5) එම කාලයේ පවතින ශබ්ද දූෂණය නිසා සතුන් තැති ගැනීමයි. (2008)

➤ **අංක 88 සහ 89 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් රෝග සැලකිල්ලට ගන්න.**
A – නිව්කාසල් (රැනිකට්) රෝගය
B – කුකුළු වසූරිය
C – පුල්ලෝරම් රෝගය
D – කොක්සිඩියෝසිස් රෝගය
E – කුරුළු උණ රෝගය

(88) ඉහත රෝග අතුරෙන් වෛරස් මගින් ඇතිවන රෝග වනුයේ,
1) A, B සහ C පමණි. 2) A, B සහ E පමණි. 3) B,C සහ D පමණි.
4) B, C සහ E පමණි. 5) C, D සහ E පමණි. (2008)

(89) ඉහත රෝග අතුරෙන් ප්‍රෝටසෝවා හේතුවෙන් ඇතිවන රෝගය වන්නේ,
1) A ය. 2) B ය. 3) C 4) D ය. 5) E ය. (2008)

(90) කුකුළු පාලනයට සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දක්වේ.
A – සතුන්ට ආහාර හා ජලය සැපයීම.
B – අභිජනනය සහ නව ප්‍රභේද නිපදවීම.
C – මනා සෞඛ්‍යාරක්ෂක තත්ත්ව සැපයීම.
D – රෝග වළක්වා ගැනීම.
ඉහත ක්‍රියාකාරකම් අතුරෙන් වාණිජ කුකුළු ගොවිපොළක එදිනෙදා කටයුතුවලට ඇතුළත් වන්නේ,
1) A, B සහ C පමණි. 2) A, B සහ D පමණි. 3) A,C සහ D පමණි.
4) B, C සහ D පමණි. 5) A, B, C සහ D යන සියල්ලම ය. (2008)

(91) පහත දක්වෙන්නේ ගොවිපොළ සතුන්ගේ දැකිය හැකි හෝර්මෝන වර්ග කිහිපයකි.
A – ඊස්ට්‍රජන්.
B – ප්‍රොජෙස්ටරෝන්.
C – ලුටිනීකරණ හෝර්මෝනය (LH).
D – ස්‍යූනිකා උත්තේජන හෝර්මෝනය (FSH – Follicle Stimulating Hormone).
E – ඇඩ්‍රිනලින්.
ඉහත හෝර්මෝන අතුරෙන්, එළදෙනකගේ මද චක්‍රය කෙරෙහි බලපාන හෝර්මෝන වන්නේ,
1) A, B, C සහ D පමණි. 2) A, B, C සහ E පමණි. 3) A, B, D සහ E පමණි.
4) A, C, D සහ E පමණි. 5) B, C, D සහ E පමණි. (2008)

(92) කිරි ගවයෙකුගේ කිරි නිෂ්පාදනයට බලපාන ප්‍රධාන කාලගුණික සාධක වනුයේ,
1) පරිසර උෂ්ණත්වය හා සුළඟේ වේගයයි.
2) පරිසර උෂ්ණත්වය හා ආලෝක තීව්‍රතාවයි.
3) පරිසර උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාවයි.
4) පරිසර උෂ්ණත්වය හා දිවා කාලයේ දිගයි.
5) ආලෝක් තීව්‍රතාව හා දිවා කාලයේ දිගයි. (2009)

(93) එළකිරිවල ප්‍රධාන සංඝටකය,
1) ලැක්ටෝස් සීනි වේ. 2) ප්‍රෝටීන් වේ. 3) කිරි මේද වේ.
4) මේද නොවන ඝන ද්‍රව්‍ය වේ. 5) ජලය වේ. (2009)

(94) ගොවිපළ සතුන්ට වැළඳෙන වයිරස් රෝගවලට උදාහරණ වනුයේ,
1) මැස්ටයිටිස්, ගම්බෝරෝ හා කොක්සිඩියෝසිස් ය.
2) පා සහ මුඛ රෝගය, කුරුළු උණ හා කිණිතුළු උණ ය.
3) කුකුළු වසූරිය, නිව්මෝනියා හා එළ පක්ෂගාත ය.
4) ගම්බෝරෝ, rinderpest හා කිනිතුළු උණ ය.
5) කුරුළු උණ, ගම්බෝරෝ හා පා සහ මුඛ රෝගය ය. (2009)

(95) එළදෙනකගේ ගර්භණීභාවය පවත්වාගෙන යාමට අවශ්‍ය හෝර්මෝන වනුයේ,
1) සපුනිකා උත්තේජක හෝර්මෝනය (FSH) ය. 2) ලූටිනාකාරක හෝර්මෝනය (LH) ය.
3) ඊස්ට්‍රජන් ය. 4) ප්‍රොජෙස්ටෙරෝන් ය. (2009)
5) ප්‍රෝලැක්ටින් ය.

(96) ගවයන්ගේ මද සමායෝජනය කරනුයේ,
1) මද ලක්ෂණ පැහැදිලිව දැන ගැනීමට ය.
2) කෘතිම සිංචනයට පහසු වන නිසා ය.
3) පට්ටිගොනුන් වැඩි සංඛ්‍යාවක් ඇති විට ය.
4) ඒකාකාරී ගව රැළක් අවශ්‍ය වූ විට ය.
5) එමගින් වැඩිපුර ගැහැනු වසුපැටවුන් ලබාගත හැකි නිසා ය. (2009)

(97) දෙමුහුම් ජීවීන් (HO) හා ජාන විකරණය කළ ජීවීන් (GMO) අතර ප්‍රධාන වෙනස වනුයේ,
1) දෙමුහුන් ජීවීන් බිහි කිරීම, ස්වාභාවයේ ඇති ප්‍රවේණික සංයෝජන මත රඳා පවතින අතර, ජාන විකරණය තුළ ජීවීන්ගේ ජාන එකිනෙකට වෙනස් හා සම්බන්ධයක් නැති විශේෂවලින් ලබාගෙන සංයෝජනය කරනු ලැබේ.
2) ජාන විකරණය තුළ ජීවීන් විකිණීමට අවසර ඇත්තේ සංවර්ධනය වන රටවල පමණක් වන අතර, දෙමුහුන් ජීවීන් භාවිතය හා විකිණීම ලොව ඕනෑම තැනක සිදු කළ හැක.
3) ජාන විකරණය තුළ ජීවීන් නිපදවීමට අතිරේක ශක්ති යෙදවුම් අවශ්‍ය නොවන අතර, දෙමුහුන් ජීවීන් බිහිකිරීමට විශාල වශයෙන් අතිරේක ශක්ති යෙදවුම් අවශ්‍ය වේ.
4) ජාන විකරණය කළ ජීවීන් පළිබෝධ හානිවලට ප්‍රතිරෝධී නොවන අතර, දෙමුහුන් ජීවීහු අධික ප්‍රතිරෝධයක් දක්වති.
5) ජාන විකරණය කළ ජීවීන් ගොවීන්ගේ කෙත්වල ස්වාභාවිකව ප්‍රජනනය කළ හැකි අතර, දෙමුහුන් ජීවීන් ප්‍රජනනය කළ හැක්කේ පාලිත පරිසර තත්ත්ව යටතේ පමණි. (2009)

(98) අනුරාධපුර ගොවියකු අඹේවෙල ගොවිපළෙන් (නුවරඑළිය දිස්ත්‍රික්කය) ෆ්‍රීෂියන් වර්ගයේ කිරි එළදෙනක මිලට ගෙන, අඹේවෙල ගොවිපළට සමාන ආහාර දෙමින් ඇති කළ ද කිරි නිෂ්පාදනය බරපතල ලෙස පහත වැටුණි. මෙයට ප්‍රධාන හේතුව විය හැක්කේ,
1) එළදෙනට දෙන ලද ආහාර ප්‍රමාණවත් නොවීම ය.
2) ගොවියා වෙනස් වීම ය.
3) අනුරාධපුරයේ පවතින වියළි කාලගුණය ය.
4) අනුරාධපුරයේ පවතින උණුසුම් කාලගුණය ය.
5) අනුරාධපුර ගොවිපළෙහි පවතින දුර්වල සනීපාරක්ෂක තත්ත්වය ය. (2009)

(99) කුඩා පරිමාණ ගොවියෙකුට සිය කිරිගවයාට ඔහුගේ ගොවිපළ පරිශ්‍රයෙන් පහසුවෙන් සපයාගත හැකි දළ ආහාර දීමට අවශ්‍ය විය. ගොවියාට සපයා ගත හැකි දළ ආහාර විය හැක්කේ,
1) තෘණ, ග්ලිරිසීඩියා හා කොස් ඇට වේ.
2) කොස් ඇට, මඤ්ඤොක්කා අල හා මඤ්ඤොක්කා පත්‍ර වේ.
3) බතල වැල්, තෘණ හා නොමේරූ කෙසෙල් ගෙඩි වේ.
4) කෙසෙල් කඳන්, කොස් ලෙලි (කොස් කටු) හා තෘණ වේ.
5) ඉවත දමන ලද බඩඉරිඟු ඇට, කොස් ඇට හා කජු පුහුලන් වේ. (2009)

(100) ඒක ආමාශයික සතුන්ගේ ආහාර මාර්ගයේ විවිධ කොටස්වල දී විවිධ යාන්ත්‍රණ මගින් ආහාර දිරවීම සිදු වේ. එම කොටස්වලින් එකම ආහාරය ජීරණ යාන්ත්‍රණය දක්නට ලැබෙන්නේ,
1) ග්‍රහණියෙහි හා උණ්ඩුකයෙහි ය.
2) මුඛයෙහි හා වටනයෙහි ය.
3) ආමාශයෙහි හා මහා අන්ත්‍රයෙහි ය.
4) ගොජුරෙහි හා විතංශිකාවෙහි ය.
5) වටනයෙහි හා මහා අන්ත්‍රයෙහි ය.
(2009)

(101) මෑත අතීතයේ දී සමහර ආසියාතික රටවලින්, කුකුළන්, කුකුළු නිෂ්පාදන හා කුකුළු ආහාර ශ්‍රී ලංකාවට ගෙන්වීම තහනම් කරන ලදී. මෙයට ප්‍රධාන හේතුව වූයේ,
1) විදේශ විනිමය හිඟකම ය.
2) ශ්‍රී ලංකාව තුළ එවැනි නිෂ්පාදනවලට ඇති ඉල්ලුම අඩුවීම ය.
3) අපනයන රටවල්වල ගම්බෝරෝ රෝග වසංගතයක් වාර්තාවීම ය.
4) අපනයන රටවල්වල සල්මොනෙල්ලා ආසාදනයක් වාර්තාවීම ය.
5) අපනයන රටවල්වල කුරුළු උණ වසංගතයක් වාර්තාවීම ය.
(2009)

(102) දෙනකගේ බුරුල්ල අභ්‍යන්තර වශයෙන් කොටස් හතරකට බෙදී ඇත. පහත ප්‍රකාශ අතුරෙන් වඩා නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) "මුළු කිරි නිෂ්පාදනයෙන් 60% ක් පිටුපස කොටස් තුළ නිපදවෙයි." යන්නයි.
2) "මුළු කිරි නිෂ්පාදනයෙන් 60% ක් ඉදිරිපස කොටස් තුළ නිපදවෙයි." යන්නයි.
3) "පසුපස කොටස හා ඉදිරිපස කොටස සමාන ප්‍රමාණවලින් කිරි නිපදවයි."යන්නයි.
4) "මුළු කිරි නිෂ්පාදනයෙන් 60% ක් වම් කොටස් තුළ නිපදවෙයි."යන්නයි.
5) "මුළු කිරි නිෂ්පාදනයෙන් 60% ක් දකුණු කොටස් තුළ නිපදවෙයි." යන්නයි.
(2009)

(103) වාණිජ කුකුළු ගොවිපලක ප්‍රධාන දොරටුව අසල ජල ගිල්වුමක් සාදා තිබෙන අතර ගොවිපළට ඇතුළුවන වාහනවල රෝදවලට පළමුව රසායන ද්‍රව්‍ය විසුරුවා ඉන්පසු ජල ගිල්වුම හරහා ධාවනය කිරීමට සලස්වනු ලැබේ. මෙය සිදු කෙරෙනුයේ,
1) ගොවිපළ පරිශ්‍රයට මඩ ඇතුළුවීම වැළැක්වීමට රෝද පිරිසිදු කිරීමට ය.
2) ගොවිපළ පරිශ්‍රයේ දූවිලි අඩුකර ගැනීමට ය.
3) ජෛව ආරක්ෂණ ක්‍රමයක් ලෙස ය.
4) පැහැදිලි අරමුණකින් තොරව ය.
5) කුකුළු ගොවිපළවල සිදුකෙරෙන සම්ප්‍රදායක් ලෙස ය.
(2009)

(104) ගොවිපළ සතුන්ගේ පෝෂණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – ග්ලූකෝස් හා ඇමයිනෝ අම්ල අවශෝෂණය වන්නේ සක්‍රීය ප්‍රවාහන (transport) යාන්ත්‍රණ මගිනි.
B – කුකුළන්ගේ මුඛය හොටයකින් ප්‍රතිස්ථාපනය වී ඇති බැවින් ඔවුන්ගේ යාන්ත්‍රික ජීර්ණය ගොජුර හා වටනය තුළ සිදු වේ.
C – හරකකුගේ රූමනය තුළ සිදුවන ජීර්ණය, ඌරකුගේ උණ්ඩුකය (cecum) තුළ සිදුවන ජීර්ණයට බොහෝදුරට සමාන වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A සහ B පමණි.
5) A සහ C පමණි.
(2010)

(105) බිත්තර දමන කිකිළියන් රංචුවක, බිත්තර නිෂ්පාදනය අඩු කිරීමට බෙහෙවින් බලපාන පරිසර තත්ත්ව වන්නේ,
1) අඩු සාපේක්ෂ ආර්ද්‍රතාව, වැඩි පරිසර උෂ්ණත්වය සහ දිගු දිවාකාලය වේ.
2) වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාව, වැඩි පරිසර උෂ්ණත්වය සහ දිගු දිවාකාලය වේ.
3) අඩු සාපේක්ෂ ආර්ද්‍රතාව, අඩු පරිසර උෂ්ණත්වය සහ කෙටි දිවාකාලය වේ.
4) වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාව, වැඩි පරිසර උෂ්ණත්වය සහ කෙටි දිවාකාලය වේ.
5) අඩු සාපේක්ෂ ආර්ද්‍රතාව, අඩු පරිසර උෂ්ණත්වය සහ දිගු දිවාකාලය වේ.
(2010)

(106) සුලබ වෛරස් රෝග වැළැක්වීම සඳහා සුදුසු එන්නත්කරණ වැඩසටහන් අත්‍යාවශ්‍ය ය. මෙබඳු එන්නත්කරණ මගින් සාර්ථකව වැළැක්විය හැකි රෝග කිහිපයක් වනුයේ,
1) කොක්සිඩියෝසිස්, රැනිකට්, කුකුළු වසූරිය සහ මැස්ටයිටිස් ය.
2) රැනිකට්, නියුමෝනියාව, කාලජීන්ව රෝගය (black tongue disease) සහ කුර හා මුඛ රෝගය යි.
3) ගම්බෝරෝ, කුරුළු උණ, කිරි උණ සහ රින්ඩර්පෙස්ට් ය.
4) ගම්බෝරෝ, කුකුළු වසූරිය, රැනිකට් සහ කුර හා මුඛ රෝගය ය.
5) කුරුළු උණ, රින්ඩර්පෙස්ට්, පුල්ලෝරම් සහ ආසාදිත බ්‍රොන්කයිටිස් ය.
(2010)

(107) පහත ඒවායින් කිරි ගවයකුගේ කිරි එරීමේ (milk letdown) ක්‍රියාවලිය විස්තර කෙරෙන නිවැරදි අනුපිළිවෙළ තෝරන්න.

1) බුරුල්ල උත්තේජනය → මොළයට ස්නායු ආවේජනය ලැබීම → පිටියුටරි ග්‍රන්ථිය ක්‍රියාකාරී වීම → ප්‍රොලැක්ටින් නිදහස් වීම → කිරි එරීම.
2) බුරුල්ල උත්තේජනය → ඔක්සිටොසින් ස්‍රාවය → පිටියුටරි ග්‍රන්ථිය ක්‍රියාකාරී වීම → ප්‍රොලැක්ටින් නිදහස්වීම → කිරි එරීම.
3) බුරුල්ල උත්තේජනය → මොළයට ස්නායු ආවේජනය ලැබීම → ප්‍රොලැක්ටින් ස්‍රාවය → පිටියුටරි ග්‍රන්ථිය ක්‍රියාකාරී වීම → ඔක්සිටොසින් නිදහස් වීම → කිරි එරීම.
4) බුරුල්ල උත්තේජනය → ප්‍රොලැක්ටින් නිදහස් වීම → පිටියුටරි ග්‍රන්ථිය ක්‍රියාකාරී වීම → බුරුල්ලට ස්නායු ආවේජනය ලැබීම → කිරි එරීම.
5) බුරුල්ල උත්තේජනය → මොළයට ස්නායු ආවේජනය ලැබීම → පිටියුටරි ග්‍රන්ථිය ක්‍රියාකාරී වීම → ඔක්සිටොසින් නිදහස් වීම → කිරි එරීම. (2010)

(108) "වරණය" හා "දෙමුහුම් අභිජනනය" ගොවිපොළ සතුන් වැඩි දියුණු කිරීමේ සැලසුම්වල දී යොදාගැනෙන වැදගත් මෙවලම් වේ. වරණය හා දෙමුහුම් අභිජනනය අනුපිළිවෙළින් යොදාගැනෙන ක්‍රියාදාමයට උදාහරණයක් වනුයේ,

1) ගොවියකු දේශීය ගව රැළකින් ඊළඟ පරම්පරාව බිහිකර ගැනීම සඳහා හොඳ ගැහැණු සතුන් කිහිපදෙනෙකු සමග එක් පිරිමි සතු තෝරා ගැනීම යි.
2) කුකුළු අභිජනනයේ යෙදෙන්නෙකු A වර්ගයෙන් හොඳ කිකිළියන් කිහිපදෙනෙකු තෝරාගෙන B වර්ගයේ කුකුළන් සමග එකට ඇතිකර ඔවුන්ගෙන් ලැබෙන බිත්තර රක්කවීම සඳහා යොදා ගැනීම යි.
3) ඉන්දිය සම්භවයක් සහිත එළදෙනුන් 10 ක්, යුරෝපීය ගව වර්ගයක ශුක්‍රාණු භාවිතයෙන් කෘත්‍රිම සිංචනය සිදුකර ඊළඟ පරම්පරාවේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු කිරීම යි.
4) කිරි ගොවියෙකු අඛණ්ඩව වසර 10 ක් තිස්සේ තමන් සතුව සිටි පුංගවයෙකු යොදාගනිමින් තම රැළෙහි එළදෙනුන් ගැබ්ගන්වන අතර නුසුදුසු පැටවුන් ඉවත් කිරීමයි.
5) එළු පට්ටි හිමියෙකු අලුත් වර්ගයක පිරිමි සතුන් කිහිපදෙනෙකු තම රැළට හඳුන්වා දී ඊළඟ පරම්පරාවේ දී හොඳ සතුන් තේරීමයි. (2010)

(109) මී කිරිවලට සාපේක්ෂව එළ කිරිවල,

1) ජලය හා මේදය වැඩි අතර ප්‍රෝටීන අඩු ය.
2) ජලය අඩු අතර මේද හා ප්‍රෝටීන වැඩි ය.
3) ජලය, මේදය හා ප්‍රෝටීන යන සියල්ලම අඩු ය.
4) ජලය, මේදය හා ප්‍රෝටීන යන සියල්ලම වැඩි ය.
5) ජලය වැඩි අතර මේදය හා ප්‍රෝටීන අඩු ය. (2010)

(110) සත්‍ය මද චක්‍රයක් රහිත සත්ත්ව විශේෂ සඳහා උදාහරණ වනුයේ,

1) මී ගවයින්, බැටළුවන්, ඌරන් සහ එළුවන් ය.
2) කුකුළන්, කළුකුං, තාරාවන් හා හාවුන් ය.
3) ඌරන්, පාත්තයින්, බැටළුවන් හා එළුවන් ය.
4) කළුකුං, ගිනිකුකුළන්, හාවුන් සහ ඌරන් ය.
5) බැටළුවන්, එළුවන්, හාවුන් හා වටුවන් ය. (2010)

(111) එළදෙනකගේ මද චක්‍රයේ සිදුවන හෝර්මෝන වෙනස්කම් පහත රූපයෙන් දක්වේ.
A හා B හෝර්මෝන වනුයේ පිළිවෙලින්,



1) ලූටිනකරණ හෝර්මෝනය (LH) හා ප්‍රොජෙස්ටරෝන් වේ.
2) ප්‍රොජෙස්ටරෝන් හා ලූටිනකරණ (LH) හෝර්මෝනය වේ.
3) ප්‍රොජෙස්ටරෝන් හා ඊස්ට්‍රජන් වේ.
4) ලූටිනකරණ හෝර්මෝනය (LH) හා ඊස්ට්‍රජන් වේ.
5) සුපුනිකා උත්තේජක හෝර්මෝනය (FSH) හා ඊස්ට්‍රජන් වේ. (2010)

(112) කිරි නිෂ්පාදනය ඉතා අඩු දේශීය ගවයෝ විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ සිටිති. මෙම සතුන්ගේ නිෂ්පාදනය දියුණු කිරීමේ වඩාත් ඉක්මන් ක්‍රමය වන්නේ,
1) හොඳම සතුන් තෝරා ගැනීම ය.
2) යුරෝපීය ගව වර්ගයක පිරිමි ගවයින් මගින් පැටව් දමා ඔවුන් වැඩි දියුණු කිරීම ය.
3) ඉන්දියන් ගව වර්ගයක ශුක්‍රාණු යොදාගනිමින් කෘත්‍රිම සිංචනය කර ඔවුන් වැඩි දියුණු කිරීම ය.
4) ඔවුන්ට උසස් ගුණාත්මයෙන් යුත් ආහාර ලබාදීම ය.
5) හොඳම සතුන් තෝරාගෙන ඔවුන් සූක්ෂ්ම ක්‍රමය යටතේ පාලනය කිරීම ය. (2010)

(113) ගොවියකු 2010 මාර්තු 1 දින ජර්සි නැම්බියක් කෘත්‍රිම සිංචනය කළ අතර එය සාර්ථක වූ බව නිරීක්ෂණය කරන ලදී. ඔහුට මුලින්ම කිරි ලබාගැනීමට හැකි වනුයේ,
1) 2010 සැප්තැම්බර් 15 වන දින ය.
2) 2010 ඔක්තෝබර් 20 වන දින ය.
3) 2010 නොවැම්බර් 05 වන දින ය.
4) 2010 නොවැම්බර් 20 වන දින ය.
5) 2010 දෙසැම්බර් 15 වන දින ය. (2010)

(114) කුකුළු ගොවිපොළක අනුගමනය කළ හැකි ජෛව ආරක්ෂණ ක්‍රමවේද වනුයේ,
1) පක්ෂීන් එන්නත් කිරීම, රෝගී සතුන් ඉවත් කිරීම හා මළ සතුන් නිසි පරිදි බැහැර කිරීම යි.
2) නිසි පරිදි නිවාස සැපයීම, ගුණාත්මක ආහාර හා සුවදායක පරිසරයක් ලබාදීමයි.
3) කටුකම්බි මගින් ගොවිපොළ වෙන්කිරීම, ආසන්නයේ ඇති විශාල ශාක හා පඳුරු ඉවත් කිරීම හා ගේට්ටුව අසල මුරකරුවකු යෙදවීම යි.
4) දැල් මගින් ගොවිපොළ වෙන්කිරීම, ගොවිපොළට ඇතුළුවන හා පිටවන සියලු දෙනාම පරීක්ෂා කිරීම හා කුකුළු නිවාසවල සනීපාරක්ෂක තත්ත්ව පවත්වා ගැනීම යි.
5) දැල් මගින් ගොවිපොළ වෙන්කිරීම, ගේට්ටුව වසා තැබීම හා කුකුළු නිවාසවල වැඩකරන විට දී කබා ඇඳීමයි. (2010)

(115) එක්තරා පුද්ගලයෙක් ඔහු මිල දී ගත් මුදවපු කිරි හට්ටි තුනෙන් එකක් එළකිරිවලින් නිපදවා ඇති බව දැන ගත්තේ ය. ඔහුගේ නිරීක්ෂණයට හේතු විය හැක්කේ,
1) මුදවපු එළකිරි සුදු පැහැවන අතර, ඝනබව අඩුවීම ය.
2) මුදවපු එළකිරි කහ පැහැවන අතර, වඩාත් ඝනබවෙන් යුතුවීම ය.
3) මුදවපු මී කිරි සුදු පැහැවන අතර, වඩාත් ඝනබවෙන් යුතුවීම ය.
4) මුදවපු මී කිරි කහ පැහැවන අතර, ඝනබවෙන් අඩුවීම ය.
5) වර්ග දෙකෙහිම මුදවපු කිරි සුදු පැහැති නමුත් මුදවපු මී කිරි වඩාත් ඝනබවෙන් යුතුවීම ය. (2011)

(116) "කිරි උණ"
1) බැක්ටීරියානු රෝගයකි.
2) වයිරස ආසාදනයකි.
3) පරිවෘත්තිය රෝගයකි.
4) විටමින ඌනතාවකි.
5) ඛනිජ ඌනතාවකි. (2011)

(117) ශ්‍රී ලංකාවේ ගව නිෂ්පාදනය සඳහා ඇති විභවතා කිහිපයක් වනුයේ,
1) ස්වාභාවික තෘණ බිම් පැවතීම, විශාල වශයෙන් දේශීය ගව රංචු සිටීම හා කෘත්‍රිම සිංචන පහසුකම් නොමැති වීම ය.
2) උචිත රාජ්‍ය ප්‍රතිපත්ති, කිරි නිෂ්පාදන සඳහා විශාල ඉල්ලුමක් පැවතීම හා කිරි සඳහා හොඳ මිලක් තිබීම ය.
3) පෞද්ගලික අංශයේ ආයෝජන, යාන්ත්‍රීකරණ පහසුකම් වැඩිවීම හා අසීමිත ඉඩම් ප්‍රමාණයක් තිබීම ය.
4) පහසුවෙන් ලබාගත හැකි ශ්‍රමය, අභිජනන සතුන් සිටීම හා වැඩිදියුණු කරන ලද තෘණ බීජ සුලබව තිබීම ය.
5) ඉහළ ගුණාත්මයෙන් යුත් සත්ත්ව ආහාර, වැඩි දියුණු කළ කිරි එකතු කිරීමේ ජාලය, සැකසීමේ පහසුකම් තිබීම හා විශාල ලෙස කිරිපිටි ආනයනය කිරීම ය. (2011)

(118) මුල් කිරි,
1) යනු ක්ෂීරණයේ ප්‍රථම සති දෙකේ දී දෙනකගෙන් ලැබෙන කිරි වේ.
2) වැඩිපුර ඝනද්‍රව්‍ය අඩංගුවන බැවින් සාමාන්‍ය කිරිවලට වඩා ඝනකමින් යුක්ත ය.
3) ජීර්ණය අපහසු බැවින් රෝගී සතුන්ට **නොදිය** යුතු ය.
4) ප්‍රධාන වශයෙන් බුරුළු ප්‍රදාහය (Mastitis) ආසාදිත දෙනුන්ගේ දැකිය හැකි ය.
5) පැටියා කිරි බීමට පෙර ඉවත් කළ යුතු ය. (2011)

(119) පෙර කිරි පරීක්ෂාව (Strip Cup Test) යොදා ගනුයේ,
1) කිරිවල ඇති මේද ප්‍රමාණය පරීක්ෂා කිරීමට ය.
2) එළදෙන යම් රෝගයකින් පෙළෙද්දැයි දැන ගැනීමට ය.
3) බුරුල්ලට මැස්ටයිටිස් ආසාදනය වී ඇත්දැයි දැන ගැනීමට ය.
4) තනපුඩුවල තත්ත්වය පරීක්ෂා කිරීමට ය.
5) කිරිවල ඇති SNF ප්‍රමාණය දැන ගැනීමට ය. (2011)

(120) රනිකට්, සැල්මොනෙල්ලා හා කොක්සිඩියෝසිස් රෝග වැළැක්වීම සඳහා වඩාත් එලදායී ක්‍රියාමාර්ග වනුයේ,
1) සතුන් එන්නත් කිරීම, ප්‍රතිජීවක සැපයීම හා හොඳ සනීපාරක්ෂක තත්ත්ව පවත්වාගෙන යාම වේ.
2) සතුන් එන්නත් කිරීම, කූඩු තුළ සතුන් ඇති කිරීම හා ජෛව ආරක්ෂණ ක්‍රම යොදා ගැනීම වේ.
3) අතුරණුව හොඳ තත්ත්වයෙන් පවත්වා ගැනීම, ප්‍රතිජීවක ලබාදීම හා අමුත්තන් ඇතුළු වීම වැළැක්වීම වේ.
4) සතුන් එන්නත් කිරීම, ප්‍රතිරෝධී වර්ග අභිජනනය කිරීම හා යනපත් කළමනාකරණ පිළිවෙත් පවත්වාගෙන යාම වේ.
5) ප්‍රතිජීවක ලබාදීම, අතුරණුව මාරු කිරීම හා රෝගී සතුන් පිටලෑම වේ. (2011)

(121) කුකුළන් පිටලෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – බ්‍රොයිලර් සතුන් කෙටි කාලයක් තබා ගන්නා බැවින් බිත්තර නිෂ්පාදනයේදීට වඩා බ්‍රොයිලර් නිෂ්පාදනයේ දී පිටලෑම වඩාත් වැදගත් වේ.
B – ඒකාකාරී සතුන් රැලක් පවත්වා ගැනීම සඳහා පිටලෑම අවශ්‍යතාවක් වන බැවින් එය නොකඩවා සිදු කළයුතු කටයුත්තකි.
C – පිටලෑමේ ප්‍රතිඵලයක් වශයෙන් ගොවිපළ සම්පත් හා යෙදවුම් කාර්යක්ෂම ලෙස භාවිතයට ඉඩ සැලසේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
1) A පමණි. 2) A හා B පමණි. 3) A හා C පමණි.
4) B හා C පමණි. 5) A ,B හා C යන සියල්ලම ය. (2011)

(122) ගොවිපළ සතුන් කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – ඉහළ උෂ්ණත්වය සමඟ පවතින ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාව කිරි දෙනුන්ගේ කිරි අස්වැන්න අඩු කරයි.
B – ඉහළ උෂ්ණත්වය, බිත්තර දමන කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය අඩු කරන නමුත් එයට සූර්යාලෝකයේ බලපෑමක් නැත.
C – ගවයන් හා කුකුළන්, අඩු උෂ්ණත්වයේ දී, වැඩි උෂ්ණත්වයේදීට වඩා සක්‍රිය බවක් පෙන්වයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි. 2) A හා B පමණි. 3) A හා C පමණි.
4) B හා C පමණි. 5) A, B හා C සියල්ලම ය. (2011)

(123) ආලෝකය ලැබෙන කාල සීමාවට වඩාත් සංවේදී වන ගොවිපළ සතුන් කාණ්ඩය වනුයේ,
1) බිත්තර දමන කිකිළියන් ය. 2) මස් පිණිස ඇති කරන ගවයින් ය.
3) තරකරන ඌරන් ය. 4) බ්‍රොයිලර් කුකුළන් ය.
5) ඉහළ නිෂ්පාදනයක් සහිත කිරි ගවයින් ය. (2012)

(124) දෙනකගෙන් කිරි දෙවීමට මොහොතකට පෙර "Stip Cup Test'' පරීක්ෂාව කරනු ලබන්නේ,
1) දෙන උත්තේජනය කිරීමට ය.
2) නිසි කිරි දෙවීමේ ක්‍රියාවලිය සහතික කර ගැනීමට ය.
3) දෙන සාමාන්‍යයෙන් නිරෝගිද' යි පරීක්ෂා කිරීමට ය.
4) දෙනට මැස්ටයිටිස් රෝගය වැළදී ඇත්ද' යි පරීක්ෂා කිරීමට ය.
5) දොවා ගන්නා කිරි පිළිගත හැකි තරම් ගුණාත්මයකින් යුක්තද' යි පරීක්ෂා කිරීමට ය. (2012)

(125) සත්ත්ව අභිජනන ක්‍රම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A – කුඩා පරිමාණ කිරි ගව ගොවිපලක දෙනුන්ගේ කිරි නිෂ්පාදනය නැංවීමට වරණය සාර්ථකව යොදා ගත හැකි ය.
B – කෙටි කාලයක් තුළ සතුන්ගේ ඵලදායිතාව වැඩි කරගැනීමට දෙමුහුන් කිරීම යොදා ගත හැකි ය.
C – ''දෙමුහුන් දිරිය'' දෙමුහුන් අභිජනනයේ වාසියකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි.
2) B පමණි.
3) C පමණි.
4) A සහ B පමණි.
5) B සහ C පමණි.
(2012)

(126) හොඳ ගුණාත්මයෙන් යුත් තෘණ සයිලේජ්වල ඇති වඩාත් ප්‍රමුඛ වාෂ්පශීලී මේද අම්ලය (VFA) වනුයේ,
1) ඇසිටික් අම්ලය වේ.
2) බියුටරික් අම්ලය වේ.
3) ෆෝමික් අම්ලය වේ.
4) පයිරුවික් අම්ලය වේ.
5) ප්‍රෝපියෝනික් අම්ලය වේ.
(2012)

(127) ගොවිපළ සතුන්ගේ ආහාර ජීර්ණ ක්‍රියාවලිය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,
1) ආහාරයේ ඇති ප්‍රෝටීන් ජීරණයට ආමාශයෙන් ට්‍රිප්සින් ස්‍රාවය වේ.
2) සංකීර්ණ ආමාශය තුළ එන්සයිමීය ජීරණය සිදු නොවේ.
3) කිකිළියකගේ වටනය තුළ ආහාරවල එන්සයිමීය හා යාන්ත්‍රික ජීරණය සිදු වේ.
4) කුකුළන් තුළ රූමයනයන් නොමැති බැවින් ක්ෂුද්‍රජීවී ජීරණයට උපකාරී වනු පිණිස උණ්ඩුක දෙකක් පිහිටා ඇත.
5) රූමනය තුළ සිදුවන ක්ෂුද්‍රජීවී ජීරණය, මහා අන්ත්‍රයේ සිදුවන එම ක්‍රියාවලියට තාත්පසින්ම වෙනස් ය.
(2012)

(128) සුදු පැහැති බිත්තර දමන කිකිළි වර්ග වනුයේ,
1) බ්‍රහ්මා, කොචින් සහ ඇන්කෝනා වේ.
2) සසෙක්ස්, ගම් කිකිළියන් සහ ඕර්පින්ග්ටන් වේ.
3) ඔස්ට්‍රලොප්, කෝර්නිෂ් සහ වයිට් ලෙගෝන් වේ.
4) වයිට් ලෙගෝන්, බ්‍රවුන් ලෙගෝන් සහ මිනෝකා වේ.
5) ආර් අයි ආර්. නිව් හැම්ෂේෂයර් සහ වයිට් ප්ලිමත් රොක් වේ.
(2012)

(129) බ්‍රොයිලර් සතුන් මැරීමට පෙර ඔවුන් නිරාහාරව තැබීමට ප්‍රධාන හේතුව වනුයේ,
1) මළකඳ ශුද්ධ කිරීම පහසු කිරීමට ය.
2) ආහාර කාර්යක්ෂමතාව (FCR) වැඩි කිරීමට ය.
3) අනවශ්‍ය ලෙස ආහාර අපතේ යාම වැළැක්වීමට ය.
4) සතුන් මැරීමේ හා සැකසීමේ ක්‍රියාවලිය පිරිසිදුව කිරීමට පහසු වීමට ය.
5) මළකඳෙහි ශුද්ධ කළ බර ප්‍රතිශතය වැඩි කිරීමට ය.
(2012)

(130) කැබිනට් ආකාරයේ බිත්තර රක්කවනයක ඇසුරුම් කුටීරයේ සිට රක්කවන කුටීරයට බිත්තර මාරු කළ යුත්තේ,
1) 14 වන රැකුම් දිනයේ දී ය.
2) 16 වන රැකුම් දිනයේ දී ය.
3) 18 වන රැකුම් දිනයේ දී ය.
4) 20 වන රැකුම් දිනයේ දී ය.
5) 21 වන රැකුම් දිනයේ දී ය.
(2013)

(131) බිත්තර දමන වර්ගයේ කිකිළි පැටවුන් සාමාන්‍යයෙන් රක්කවනු ලබන්නේ,
1) සති 3 කි.
2) සති 4 කි.
3) සති 5 කි.
4) සති 6 කි.
5) සති 7 කි.
(2013)

(132) ශක්ති පරිපූරක සඳහා උදාහරණ තුනක් වනුයේ,
1) බඩඉරිඟු, සහල් නිවුඩු සහ පොල් පුන්නක්කු ය.
2) ඌරු තෙල්, සහල් නිවුඩු සහ බඩඉරිඟු ය.
3) බඩඉරිඟු, සෝගම් සහ කුකුළු අතුරු නිෂ්පාදන අන්නය ය.
4) සෝයා අන්නය, පොල් පුන්නක්කු සහ මස් අන්න ය.
5) සෝයා අන්නය, පොල් පුන්නක්කු සහ සුනු සහල් ය.
(2013)

(133) ගොවියෙකුට කිලෝ ග්‍රෑම් 400 ක් බර එළදෙනෙක් සිටියි. මෙම එළදෙනට ආහාර ලෙස සැපයීමට දිනකට අවශ්‍ය නැවුම් තණකොළ ප්‍රමාණය සාමාන්‍යයෙන්,
1) කිලෝ ග්‍රෑම් 10 කි.
2) කිලෝ ග්‍රෑම් 20 කි.
3) කිලෝ ග්‍රෑම් 30 කි.
4) කිලෝ ග්‍රෑම් 40 කි.
5) කිලෝ ග්‍රෑම් 50 කි.
(2013)

(134) තන්තු අධික ආහාරයක් දුන් විට රූමනයේ දක්නට ලැබෙන ප්‍රමුඛතම වාෂ්පශීලි මේද අම්ලය වනුයේ,
1) ප්‍රොපියොනික් අම්ලය ය. 2) බියුට්‍රික් අම්ලය ය. 3) ඇසිටික් අම්ලය ය.
4) ෆෝමික් අම්ලය ය. 5) ලැක්ටික් අම්ලය ය. (2013)

(135) කිරි මුදා හැරීම නිශේධනය කළ හැක්කේ,
1) ඔක්සිටෝසින්වලට ය. 2) සූර්යාලෝකයට ය. 3) ඇඩ්‍රිනලින්වලට ය.
4) ඊස්ට්‍රජන්වලට ය. 5) ඉන්සියුලින්වලට ය. (2013)

(136) කිකිළියකගේ ඩිම්බ සංසේචනය සිදු වන්නේ,
1) යෝනි මාර්ගයේ දී ය. 2) මැග්නමයේ දී ය. 3) ගර්භාෂයේ දී ය.
4) පුනීලයේ දී ය. 5) කෘකාටයේ දී ය. (2013)

(137) ඊරියකගේ හා එළදෙනකගේ මද (estrus) චක්‍රයේ සාමාන්‍ය දිග වනුයේ පිළිවෙලින් දින,
1) 18 හා 18 කි. 2) 18 හා 21 කි. 3) 21 හා 18 කි.
4) 21 හා 21 කි. 5) 30 හා 30 කි. (2013)

(138) කිරි දෙවීමට පෙර පෙරහන් කෝප්ප පරීක්ෂාව කරනුයේ,
1) කිරිවල මේද ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට ය.
2) කිරිවල වර්ණය ඇගයීමට ය.
3) කිරිවල අඩංගු මුළු ඝන ද්‍රව්‍ය ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමට ය.
4) මැස්ටයිටිස් පරීක්ෂා කිරීමට ය.
5) බෲසෙල්ලොසිස් පරීක්ෂා කිරීමට ය. (2013)

(139) 2014 වසරේ මුල් කාලයේ දී ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශ තුළ ගවයන් හා ගවමස් ප්‍රවාහනය කිරීම සීමා කරනු ලැබී.
1) ගව රක්තපාත රෝග වසංගතය නිසා ය. 2) කුර හා මුඛ රෝග වසංගතය නිසා ය.
3) වයිරස් උණ රෝග වසංගතය නිසා ය. 4) ඇන්ත්‍රැක්ස් රෝග වසංගතය නිසා ය.
5) කාල ගාත්‍ර රෝග වසංගතය නිසා ය. (2014)

(140) ශ්‍රී ලංකාවේ ගව ගහනයෙන් විශාල ප්‍රමාණයක් දේශීය ගවයන්ගෙන් සමන්විත ය. දේශීය ගවයන්ගෙන් බහුතරය දක්නට ලැබෙනුයේ,
1) මැදරට තෙත් කලාපයේ ය. 2) උඩරට ය. 3) පහතරට තෙත් කලාපේ ය.
4) පහතරට වියළි කලාපයේ ය. 5) අතරමැදි කලාපයේ ය. (2014)

(141) ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලන අංශය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක් වේ.
A – වඩාත් වර්ධනය වූ උප අංශය ලෙස කුකුළු පාලන අංශය සැලකේ.
B – සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වර්තමානයේ දී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.
C – හොඳ ගුණාත්මයෙන් යුත් අභිජනන සතුන් හිඟ වීම කිරි කර්මාන්තයේ සංවර්ධනයට ගැටලුවකි.
D – රටෙහි කිරි අවශ්‍යතාවයෙන් 80% ක් පමණ දේශීය ව නිෂ්පාදනය වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A හා B පමණි. 2) A හා C පමණි. 3) B හා C පමණි.
4) B හා D පමණි. 5) C හා D පමණි. (2014)

(142) වාණිජ ගොවිපළවල ඇති කරන බිත්තර දමන කිකිළියන්,
1) පාරිශුද්ධ වර්ග වේ.
2) පාරිශුද්ධ වර්ගවලින් වරණය කළවුන් වේ.
3) එකම වර්ගයේ විවිධ පෙළපත් අතර සිදු කළ මුහුන් වේ.
4) විවිධ වර්ග අතර සිදු කළ මුහුන් වේ.
5) කුකුළු අභිජනකයන් නිපදවූ විශේෂ වර්ග වේ. (2014)

(143) ඔස්ට්‍රාලොප් යන කුකුළු වර්ගය,
1) ඉංග්‍රීසි පන්තියට අයත් බර වර්ගයකි.
2) ඇමෙරිකානු පන්තියට අයත් බර වර්ගයකි.
3) මධ්‍යධරණී පන්තියට අයත් සැහැල්ලු වර්ගයකි.
4) ඇමෙරිකානු පන්තියට අයත් ද්විකාර්ය වර්ගයකි.
5) ආසියානු පන්තියට අයත් මාංශ ආකාරයේ වර්ගයකි. (2014)

(144) බිත්තර දමන ආකාරයේ කිකිළි පැටවුන් සාමාන්‍යයෙන් රකිනු ලබන කාලය වනුයේ.
1) සති 2 කි. 2) සති 3 කි. 3) සති 4 කි. 4) සති 5 කි. 5) සති 6 කි.(2014)

(145) කිරිදෙනුන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A – මැස්ටයිටිස් රෝගය වැළඳී ඇත්ද'යි දැනගැනීම සඳහා කිරි දෙවීමට පෙර ස්ට්‍රේප් කප් පරීක්ෂාව සිදු කළ යුතුය.
B – හෝර්මෝන ක්‍රියාකාරීත්වය අහෝසි වන නිසා කිරි දෙවීම මිනිත්තු 12 ක් තුළ සම්පූර්ණ කළ යුතුය.
C – ඉහළ කිරි අස්වැන්නක් ලබා ගැනීම සඳහා කිරි දෙවීමට පෙර, දෙන උත්තේජනය කිරීම වැදගත් ය.
D – අතින් කිරි දෙවීමේ දී එක් වරකට එක් පුඩුවක් පමණක් කිරි දෙවීම සිදු කළ යුතුය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A හා B පමණි. 2) A හා C පමණි. 3) A හා D පමණි.
4) B හා C පමණි. 5) C හා D පමණි. (2014)

(146) කුකුළු ගොවිපලක ගම්බෝරෝ හටගැනීම වැළැක්වීම සඳහා පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.
A – මුල් අවධියේ දී රැල එන්නත් කිරීම.
B – සාර්ථක ජෛව ආරක්ෂණ ක්‍රම යොදා ගැනීම.
C – රක්කවන කාලය තුළ දී ඖෂධ අඩංගු ජලය බීමට දීම.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
1) A පමණි. 2) B පමණි. 3) C පමණි.
4) A හා B පමණි. 5) A හා C පමණි. (2014)

(147) ගොවිපළ සතුන්ගේ ආහාර ජීර්ණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A – කුකුළන්ගේ ජීර්ණ ක්‍රියාවලියේ දී ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය සිදු නොවේ.
B – රූමනයේ සිටින ක්ෂුද්‍ර ජීවීන් නිසා ගව ආහාරවල ඇති සෙලියුලෝස්, වාෂ්පශීලී මේද අම්ල බවට පරිවර්තනය වේ.
C – දළ ආහාරවල 18% ට වඩා දළ තන්තු අඩංගු විය යුතු ය.
D – සත්ත්වයකුගේ ග්‍රහණී තුළ විස්තීරණ එන්සයිමීය ජීර්ණය සිදු වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
1) සියල්ල නිවැරදිය.
2) A හා B සාවද්‍ය වන අතර, C හා D නිවැරදි වේ.
3) A නිවැරදි වන අතර, එය තවදුරටත් D මගින් සනාථ වේ.
4) C නිවැරදි වන අතර , එය තවදුරටත් B මගින් සනාථ වේ.
5) D පමණක් නිවැරදි ය. (2014)

(148) කිරි පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
A – කැල්සියම් හා විටමින් D වලින් සරුය.
B – රත් කිරීමේ දී කැල්සියම්, කේසීන් සමග සම්බන්ධ වී කැල්සියම් කේසිනේට් බවට පරිවර්තනය වේ.
C – කැල්සියම් කේසිනේට් සෑදීම සඳහා විටමින් D අත්‍යාවශ්‍ය වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
1) A නිවැරදි වන අතර, B හා C වැරදි ය.
2) A හා B නිවැරදි වන අතර, C වැරදි ය.
3) A හා B වැරදි වන අතර, C නිවැරදි ය.
4) A වැරදි වන අතර, B හා C නිවැරදි ය.
5) B වැරදි වන අතර, A හා C නිවැරදි ය. (2014)

➢ පහත වගුවේ දත්තවලින් බ්‍රොයිලර් ගොවිපොළක සේවකයන් සංඛ්‍යාව හා මාසික නිපැයුම දක්වේ. ඉතිරි යෙදවුම් නියතව පවතී. ප්‍රශ්න අංක 149 ට පිළිතුරු දීමට මෙම වගුව යොදා ගන්න.

සේවකයින් සංඛ්‍යාව	1	2	3	4	5	6
බ්‍රොයිලර් නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම්)	1000	2500	3500	4200	4300	4280

(149) සේවකයෙක් සඳහා හීනවන ආන්තික ඵලදාව ආරම්භ වනුයේ,
1) පළමුවෙනි සේවකයාට පසුව ය.
2) දෙවෙනි සේවකයාට පසුව ය.
3) තුන්වෙනි සේවකයාට පසුව ය.
4) හතරවෙනි සේවකයාට පසුව ය.
5) පස්වන සේවකයාට පසුව ය. (2014)

(150) සතුන්ගෙන් මිනිසාට බෝ වන රෝගයකට උදාහරණයක් වනුයේ,
1) කුරුළු උණ ය.
2) ඇන්ත්‍රැක්ස් ය.
3) කුකුළු වසූරිය ය.
4) පුල්ලෝරම් ය.
5) කුර හා මුඛ රෝගය ය. (2015)

(151) වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩිම කුකුළු ගහණයක් දක්නට ලැබෙන්නේ,
1) කෑගල්ල දිස්ත්‍රික්කයේ ය.
2) කළුතර දිස්ත්‍රික්කයේ ය.
3) කොළඹ දිස්ත්‍රික්කයේ ය.
4) ගම්පහ දිස්ත්‍රික්කයේ ය.
5) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ය. (2015)

(152) උපතේ සිට පළමු සතිය තුළ ගව පැටියකුට සැපයිය යුතු කිරි ප්‍රමාණය එම සතාගේ දේහ බරෙහි ප්‍රතිශතයක් ලෙ,
1) 2.5% විය යුතු ය.
2) 5.0% විය යුතු ය.
3) 7.5% විය යුතු ය.
4) 10.0% විය යුතු ය.
5) 12.5% විය යුතු ය. (2015)

(153) ශ්‍රී ලංකාව තුළ ප්‍රිසියන් දෙනුන් යොදා ගනිමින් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ඉහළම විභවයක් ඇත්තේ,
1) වියළි කලාපයේ ය.
2) උඩරට ය.
3) මැදරට ය.
4) පොල් ත්‍රිකෝණයේ ය.
5) පහත රට තෙත් කලාපයේ ය. (2015)

(154) නිසි අභිජනන වැඩපිළිවෙළකට පසු පැටවුන් මනාව පාලනය කිරීම නිසා දේශීය ගවයන්ගේ කිරි නිෂ්පාදනය වැඩි වීමට හේතු ගුරුතුමියක විසින් ශිෂ්‍යයකුගෙන් විමසන ලදි. ශිෂ්‍යයා විසින් පහත හේතු ඉදිරිපත් කරන ලදී.

A – අභිජනනය මගින් දේශීය ගවයන්ගේ ප්‍රවේණික විභවය වැඩි දියුණු වී ඇත.

B – අභිජනන වැඩසටහනෙන් පසුව සතුන් පරිසරයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරගෙන වැඩිපුර නිෂ්පාදනය කරයි.

C – ඉහළ කිරි නිෂ්පාදනයකට දායක වන ප්‍රධාන සාධකය මනා පාලනයයි.

ඉහත හේතු අතුරෙන් නිවැරදි විය හැකි වන්නේ,
1) A පමණි. 2) B පමණි. 3) C පමණි. 4) A හා B පමණි. 5) A හා C පමණි. (2015)

(155) ගොවිපොළ සතුන් සඳහා වූ සාන්ද්‍ර ආහාර මිශ්‍රණවල ශක්ති පරිපූරක ලෙස යොදා ගත හැකි කෘෂි කර්මාන්ත අතුරුඵල සඳහා උදාහරණ කිහිපයක් වනුයේ,
1) සහල් නිවුඩු (polish), මොලැසස් හා කැඩුණු සහල් ය.
2) සහල් නිවුඩු (bran), පොල් පුන්නක්කු හා තිරිඟු නිවුඩු ය.
3) කටුපොල් මඳ තෙල් අන්නය, සහල් නිවුඩු (polish) හා මොලැසස් ය.
4) කරවල කුඩු, සෝයා බෝංචි අන්නය හා ඉවතලන විස්කෝතු ය.
5) බඩ ඉරිඟු, පොල් පුන්නක්කු සහ කුකුල් අතුරුඵල අන්නය ය. (2015)

(156) ගොවිපොළ සතුන්ගේ ආහාර ජීරණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A – තන්තු ජීරණය සැම විටම ක්ෂුද්‍රජීවී පැසීම සමග සම්බන්ධ ය.

B – සරල ආමාශයික හා රෝමාන්තක යන සතුන් දෙවර්ගයේම එන්සයිමීය ජීරණය සිදු වේ.

C – යාන්ත්‍රික ජීරණය, ක්ෂුද්‍රජීවී ජීරණය වැඩි කරන නමුත් එන්සයිමීය ජීරණය වැඩි නොකරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්,
1) A, B හා C සියල්ල නිවැරදි ය.
2) A නිවැරදි නමුත් B හා C නිවැරදි නොවේ.
3) A හා B සැම විටම නිවැරදි වන අතර C සැම විටම නිවැරදි නොවේ.
4) B පමණක් නිවැරදි වන අතර එය සරල ආමාශයික හා රෝමාන්තක සතුන් අතර සමානත්වය පැහැදිලි කරයි.
5) A හා B දෙකම නිවැරදි වන අතර එය සරල ආමාශයික හා රෝමාන්තක සතුන් අතර වෙනස පැහැදිලි කරයි. (2015)

(157) පහත ප්‍රකාශ අතුරෙන් ගවයකුගේ සංකීර්ණ ආමාශය පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1) සංකීර්ණ ආමාශය තුළ ක්ෂුද්‍රජීවී ජීරණය සිදු වන්නේ රූමනයේ පමණි.
2) සංකීර්ණ ආමාශය, වාෂ්පශීලී මේද අම්ල අවශෝෂණය කරන ස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි.
3) සංකීර්ණ ආමාශය තුළ එන්සයිම ස්‍රාවය නොවන බැවින් එහි එන්සයිමීය ජීරණයක් සිදු නොවේ.
4) ව්‍යුහාත්මකව වෙනස් වුවත් ක්‍රියාකාරීත්වයෙන් සංකීර්ණ ආමාශය හා සරල ආමාශය සමාන ය.
5) සංකීර්ණ ආමාශයේ විශාලම කුටීරය රූමනය වන අතර කුඩාම කුටීරය විතංශිකාව වේ. (2015)

(158) කෙටි ම කාලයක දී ගොවිපොළ සතෙකුගේ නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීමට යොදා ගත හැකි අභිජනන ක්‍රමය වනුයේ,
1) වරණය ය. 2) සහාභිජනනය ය. 3) පෙළ අභිජනනය ය.
4) දෙමුහුම් අභිජනනය ය. 5) පෙළ අභිජනනයේ සහ වරණයේ සුසංයෝගය ය. (2016)

(159) කුකුළු ආහාර සලාකවලට යොදා ගන්නා ප්‍රෝටීන පරිපූරක කිහිපයකට උදාහරණය වනුයේ,
1) සහල් නිවුඩු, ඉදල් ඉරිඟු සහ සුනුසහල් ය.
2) සෝයා බෝංචි අන්නය, මත්ස්‍ය අන්නය සහ මස් අන්නය ය.
3) බඩ ඉරිඟු අන්නය, සෝයා බෝංචි අන්නය සහ සහල් නිවුඩු ය.
4) මත්ස්‍ය අන්නය, කරවල කුඩු සහ ඇටකටු අන්නය ය.
5) සෝයා බෝංචි අන්නය, පොල් පුන්නක්කු සහ ඉපිල් ඉපිල් කොල අන්නය ය. (2016)

(160) ඇමෙරිකානු පංතියට අයත් කුකුල් වර්ග කිහිපයක් වනුයේ,
1) වයිට් ප්ලිමත් රොක්, බ්‍රහ්මා සහ ඇම්රොක් ය.
2) වයිට් ලෙග්හෝන්, බ්‍රවුන් ලෙග්හෝන් සහ ඇන්කෝනා ය.
3) කෝනිෂ්, වයිට් ප්ලිමත් රොක් සහ ලයිට් සසෙක්ස් ය.
4) රෙඩ් අයිලන්ඩ් රෙඩ් (ආර් අයි ආර්), ඔස්ට්‍රාලෝප් සහ නිව්හැම්ප්ෂයර් ය.
5) රෙඩ් අයිලන්ඩ් රෙඩ් (ආර් අයි ආර්), නිව්හැම්ප්ෂයර් සහ වයිට් ප්ලිමත් රොක් ය. (2016)

(161) බිත්තර දමන කිකිළියන් 1000 ක රංචුවක් සඳහා අවශ්‍ය ප්‍රශස්ත බිත්තර දමන කැදලි සංඛ්‍යාව,
1) 50 කි. 2) 100 කි. 3) 150 කි. 4) 200 කි. 5) 250 කි. (2016)

(162) ගව පට්ටියක සිටින වසු පැටවුන්ට දළ ආහාර හඳුන්වා දිය යුත්තේ උන්ගේ වයස,
1) මාස එකක් වන විට ය. 2) මාස දෙකක් වන විට ය. 3) මාස තුනක් වන විට ය.
4) මාස හතරක් වන විට ය. 5) මාස පහක් වන විට ය. (2016)

(163) කිරි උණ යනු,
1) වෛරස් රෝගයකි. 2) පරපෝෂිත රෝගයකි. 3) බැක්ටීරියා රෝගයකි.
4) පරිවෘත්තික රෝගයකි. 5) ඌනතා රෝගයකි. (2016)

(164) කිරි ගවදෙනකගේ කිරි මුදා හැරීම සඳහා බලපාන හෝමෝනය වනුයේ,
1) ඉන්සියුලින් ය. 2) ඊස්ට්‍රජන් ය. 3) ඔක්සිටෝසින් ය.
4) ප්‍රෝලැක්ටින් ය. 5) ප්‍රොජෙස්ටරෝන් ය. (2016)

(165) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම සඳහා ඇති ප්‍රධාන විභවයක් වනුයේ,
1) තෘණ භූමිවල සුලභතාවයි.
2) කිරි ගවයින් ඇති කිරීමෙන් ලැබෙන අධික ලාභයයි.
3) කිරි සහ කිරි නිෂ්පාදනවලට ඇති අධික ඉල්ලුමයි.
4) ඉහළ අස්වනු ලබා දෙන අභිජනන සතුන් පහසුවෙන් ලබා ගැනීමට හැකි වීමයි.
5) කිරිපිටි ආනයනය සඳහා පනවා ඇති සම්බාධකයයි. (2016)

(166) පහත සඳහන් වනුයේ ගොවිපොළ සතුන් කෙරෙහි දේශගුණික බලපෑම් සම්බන්ධ වගන්ති කිහිපයකි.
A – උණුසුම් පරිසරවල දී මස් සඳහා ඇති කරන (බ්‍රොයිලර්) කුකුළන් හතිදමන අතර දහඩිය දැමීම සිදු වේ.
B – අධික උෂ්ණත්ව යටතේ දී (heat stress) සතුන් සාමාන්‍යයෙන් වැඩිපුර ජලය පානය කරන අතර, අඩුවෙන් ආහාර අනුභව කරති.
C – අධික ආර්ද්‍රතාවය යටතේ දී සතුන්ට පරිසර උෂ්ණත්වයේ බලපෑම වැඩි ය.
D – උණුසුම් පරිසර තත්ත්වයන්ට සාපේක්ෂව සතුන්ට ශීත පරිසර තත්ත්ව වඩාත් පහසුවෙන් දරා ගත හැකි ය.
ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වනුයේ,
1) A සහ B පමණි. 2) C සහ D පමණි. 3) A, B සහ C පමණි.
4) B, C සහ D පමණි. 5) A, B, C සහ D යන සියල්ල ම ය. (2016)

(167) තමාගේ කුකුළු ගොවිපලේ බිත්තර නිෂ්පාදනය දෙසැම්බර් මාසයේ දී 25% කින් අඩු වූ බව ගොවියකු විසින් නිරීක්ෂණය කරන ලදී. මෙයට වඩාත් හේතුවිය හැකි කරුණ වනුයේ,

1) කෙටි දිවා දිග ය. 2) කිකිළියන්ගේ පිහාටු හැලීම ය. 3) ශීත පරිසර ය.

4) කිකිළියන්ට අවශ්‍ය තරම් ආහාර ලබා නොදීම ය. 5) වලාකුළු සහිත පරිසරය ය. (2017)

(168) කාලගුණ විපර්යාස, ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑම් කළ හැකි ය. කාලගුණ විපර්යාසවලට වඩාත් පහසුවෙන් ගොදුරුවිය හැකි සතුන් වනුයේ,

1) කඳුරට ප්‍රදේශයේ සිටින කිරිගවයන් ය.

2) කොත්මලේ ප්‍රදේශයේ ඇති කරන විසිතුරු මසුන් ය.

3) නැගෙනහිර පළාතේ සිටින දේශීය ගවයන් ය.

4) මාතලේ දිස්ත්‍රික්කයේ සංවෘත කුකුළු කූඩුවල ඇති කරන බ්‍රොයිලර් කුකුලන් ය.

5) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාරම්පරික සහ ආස්ථරන කුකුළු කූඩුවල සිටින බිත්තර දමන කිකිළියන් ය. (2017)

(169) දේශීය ගවයන්ගේ නිෂ්පාදන හැකියාව ඉතා අඩු ය. දේශීය ගවයන්ගේ තත්ත්වය උසස් කිරීමට (upgrade) වඩාත් යෝග්‍ය ක්‍රමය වනුයේ,

1) සමූහ වරණයයි. 2) කෘත්‍රිම සිංචනයයි. 3) යුරෝපීය වර්ග සමග දෙමුහුම් කිරීමයි.

4) පළමු තේරීම සහ ඊට පසු පෙළ අභිජනනය කිරීමයි.

5) පළමුව ඉන්දීය වර්ග සමග දෙමුහුම් කොට ඊට පසු යුරෝපීය වර්ග සමග දෙමුහුම් කිරීමයි. (2017)

(170) කුකුළු ගහනය අනුව ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක ප්‍රමුඛතා අනුපිළිවෙලට ලැයිස්තුගත කළහොත් එවැනි ලැයිස්තුවක ඇති වැඩි ම කුකුළු ගහනයක් සහිත දිස්ත්‍රික්ක තුන වනුයේ,

1) කොළඹ, කුරුණෑගල සහ පුත්තලමයි. 2) කොළඹ, කුරුණෑගල සහ ගම්පහයි.

3) කුරුණෑගල, ගම්පහ සහ පුත්තලමයි. 4) කුරුණෑගල, කෑගල්ල සහ අනුරාධපුරයයි.

5) කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුරයයි. (2017)

(171) සත්ත්ව ආහාර පිළිබඳ වගන්ති කිහිපයක් පහත දක්වේ.

A – නැවුම් තෘණ යනු 18% කට වඩා දළ තන්තු සහ 4 – 6% ක් ප්‍රෝටීන අඩංගු දළ ආහාරයකි.

B – ඕනෑම සාන්ද්‍ර ආහාරයක දළ තන්තු ප්‍රමාණය 18% කට වඩා අඩු විය යුතු ය.

C – ප්‍රෝටීන පරිපූරණයක අඩංගු දළ ප්‍රෝටීන ප්‍රමාණය අවම වශයෙන් 20% ක් වත් විය යුතු අතර දළ තන්තු සුළු ප්‍රමාණයක් අඩංගු ය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ,

1) A පමණි. 2) B පමණි. 3) C පමණි. 4) A සහ C පමණි. 5) B සහ C පමණි. (2017)

(172) බිත්තර රාක්කවනයක ඇති ඇසුරුම් කුටීරයේ පවත්වා ගත යුතු ප්‍රශස්ත උෂ්ණත්වය වනුයේ,

1) 36.7 °C (98 °F) ය. 2) 37.2 °C (99 °F) ය. 3) 37.8 °C (100 °F) ය.

4) 38.3 °C (101 °F) ය. 5) 38.9 °C (102 °F) ය. (2017)

(173) අලුත ඉපදුණු වසු පැටවුන්ට ඉපදීමෙන් මුල් දින තුන තුළ දී මුල් කිරි ආහාරයට දිය යුතු ය. මෙය වැදගත් වනුයේ,

1) ඔවුන් තෘණ ආහරයට නොගන්නා නිසා ය.

2) ඉපදුණු විගස ඔවුන් සාගින්නෙන් සිටින නිසා ය.

3) සාමාන්‍ය කිරි ආහාරයට ගැනීමට එතරම් කැමැත්තක් නැති නිසා ය.

4) මුල් කිරිවල සාමාන්‍ය කිරි වලට වඩා වැඩියෙන් පෝෂක අඩංගු නිසා ය.

5) ජීරණය කිරීමෙන් තොරව අවශෝෂණය කළ හැකි පෝෂක මුල් කිරිවල අඩංගු නිසා ය. (2017)

(174) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය කිරි ගොවීන් අතර කෘත්‍රිම සිංචනය එතරම් සාර්ථක **නොවන්නේ,**

1) කෘත්‍රිම සිංචනය ඉතා වියදම් අධික ක්‍රමයක් වීම නිසා ය.

2) කෘත්‍රිම සිංචනය මගින් වැඩිපුර පිරිමි වසු පැටවුන් ලැබීම නිසා ය.

3) සතුන් මදයට පැමිණීම නිවැරදි ව හඳුනා ගැනීමට ගොවීන් අපොහොසත් වීම නිසා ය.

4) එය සාර්ථක තාක්ෂණයක් යැයි ගොවීන් විශ්වාස නොකිරීම නිසා ය.

5) බොහෝ අවස්ථාවල දී නිවැරදි වේලාවට සතුන් කෘත්‍රිම සිංචනය නොකිරීම නිසා ය. (2017)

(175) නිසිලෙස උත්තේජනය කිරීමෙන් පසු දෙනකගෙන් කිරි දෙවීම සඳහා ගොවියකු විසින් විනාඩි 10 ක කාලයක් ගන්නා ලදී. කෙසේ වුව ද ඔහු බලාපොරොත්තු වූ කිරි ප්‍රමාණය දෙනගෙන් ලබා ගැනීමට ඔහු අපොහොසත් විය. අඩු කිරි අස්වැන්නක් ලැබීමට ප්‍රධාන හේතුව වනුයේ,

1) දෙන පීඩාකාරී තත්ත්වයක සිටීම ය.

2) ගොවියා විසින් ඉතා සෙමින් කිරි දෙවීම ය.

3) ගොවියා ඉක්මනින් කිරි දොවා අවසන් කිරීම ය.

4) පෙර දිනයේ දී දෙනට අවශ්‍ය තරම් ආහාර ලබා නොදී තිබීම ය.

5) දෙනට බීමට අවශ්‍ය තරම් ජලය ලබා නොදී තිබීම ය. (2017)

15 ඒකකය
සත්ත්ව පාලනය

(1)	2	(2)	3	(3)	3	(4)	3	(5)	2	(6)	1	(7)	4	(8)	3
(9)	3	(10)	1	(11)	1	(12)	4	(13)	3	(14)	4	(15)	5	(16)	3
(17)	2	(18)	2	(19)	1	(20)	3	(21)	2	(22)	3	(23)	1	(24)	3
(25)	5	(26)	4	(27)	3	(28)	1	(29)	2	(30)	3	(31)	2	(32)	3
(33)	1	(34)	3	(35)	1	(36)	3	(37)	1	(38)	3	(39)	1	(40)	3
(41)	2	(42)	1	(43)	5	(44)	3	(45)	3	(46)	3	(47)	2	(48)	2
(49)	2	(50)	4	(51)	1	(52)	3	(53)	3	(54)	2	(55)	2	(56)	3
(57)	5	(58)	2	(59)	3	(60)	4	(61)	3	(62)	2	(63)	4	(64)	3
(65)	5	(66)	2	(67)	5	(68)	3	(69)	2	(70)	1	(71)	3	(72)	5
(73)	2	(74)	2	(75)	5	(76)	3	(77)	3	(78)	1	(79)	1	(80)	1
(81)	1	(82)	1	(83)	4	(84)	2	(85)	2	(86)	2	(87)	2	(88)	2
(89)	4	(90)	3	(91)	1	(92)	3	(93)	5	(94)	5	(95)	4	(96)	4
(97)	1	(98)	4	(99)	4	(100)	2	(101)	5	(102)	1	(103)	3	(104)	5
(105)	4	(106)	4	(107)	5	(108)	2	(109)	5	(110)	2	(111)	1	(112)	4
(113)	5	(114)	5	(115)	3	(116)	5	(117)	2	(118)	2	(119)	3	(120)	1
(121)	4	(122)	3	(123)	1	(124)	4	(125)	5	(126)	1	(127)	3	(128)	4
(129)	4	(130)	3	(131)	2	(132)	2	(133)	4	(134)	3	(135)	3	(136)	4
(137)	4	(138)	4	(139)	2	(140)	4	(141)	2	(142)	4	(143)	1	(144)	3
(145)	2	(146)	4	(147)	1	(148)	2	(149)	1	(150)	1,2	(151)	5	(152)	4
(153)	2	(154)	1	(155)	1	(156)	5	(157)	5	(158)	4	(159)	2	(160)	5
(161)	4	(162)	3	(163)	5	(164)	3	(165)	3	(166)	4	(167)	1	(168)	5
(169)	5	(170)	3	(171)	2	(172)	3	(173)	5	(174)	5	(175)	2		